නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
மாநில திறன் மேம்பாடு, தொழிற்கல்வி,
ஆராய்ச்சி மற்றும் புத்தாக்க அமைச்சகம்
State Ministry of Skills Development,
Vocational Education, Research & Innovations

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
தேசிய பயிலுநர் மற்றும் கைத்தொழில் பயிற்சி அதிகாரசபை
National Apprentice & Industrial Training Authority

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT
2021



971. ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
971, ஸ்ரீ ஜயவர்த்தனபுர மாவத்தை,வெலிக்கடை, இராஜகிரிய.
971, Sri Jayawardanapura Mawatha, Welikada, Rajagiriya

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

වාර්ෂික වාර්තාව

2021

පටුන...

සභාපතිතුමාගේ පණිවිඩය	01
සංඥාපනය	02
දැක්ම හා මෙහෙවර	03
අධිකාරියේ අරමුණු	04
අධිකාරියේ ප්‍රධාන කාර්යයන්	04
හැඳින්වීම	05
2021.....	07
ආයතනික තොරතුරු	12
පාලක මණ්ඩලය	14
අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්	16
දිස්ත්‍රික් කළමනාකරුවන්	17
පරිපාලන ව්‍යුහය	18
පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්	19
දත්ත නිරූපණය සහ විශ්ලේෂණය	24
2022 වර්ෂයේ ඉලක්ක	52
අවසන් ගිණුම් වාර්තා	53
විගණකාධිපති වාර්තාව	61

සභාපතිතුමන්ගේ පණිවුඩය.....



ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස 1971 අංක 49 දරන ආධුනිකත්ව පනත යටතේ ආරම්භ කරන ලදුව, නැවත 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ලෙස නම් කොට තවදුරටත් තම වගකීම් සහ කාර්යභාරයන් මනා ලෙස අවබෝධ කර ගනිමින් අප අධිකාරිය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ තවදුරටත් දැවැන්ත කාර්යභාරයක් ඉටු කරමින් ඉහළ ස්ථානයක වැජඹෙන බව හඳ පිරි සතුටින් දැනුම් දෙමි.

අපගේ ආයතනයෙහි ප්‍රධාන අරමුණ සහ අභිලාෂය වනුයේ රටේ ආර්ථිකයට අවශ්‍ය නිපුණත්වයෙන් හෙබි තරුණ පරපුරක් බිහි කිරීමයි.

එහෙයින් පසුගිය වසර 50 ක කාලය තුළ අප අධිකාරිය වෙත පැවරුණු විශාලතම අභියෝගයක් ලෙස, අඩු ආදායම්ලාභී පවුල් වල රැකියා විරහිත තරුණ තරුණියන් 100,000 ක් නිපුණ ශිල්පීන් ලෙස රැකියාගත කිරීම සඳහා ආධුනිකත්ව පුහුණුව ලබා දීමේ කාර්යභාරය හැඳින්විය හැක. එහිදී බහු කාර්ය සංවර්ධන හා කාර්ය සාධක බලකාය සමඟ එක්ව රැකියා විරහිත හා පාසල් හැරගිය තරුණ පරපුරට රැකියා අවස්ථා ලබා දීමත්, සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් හෙද හෙදියන් සඳහා INHCT (Institute of Nursing Health Care Training) නමින් පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමත් ඒ තුළින් ඔවුන් සවිබල ගැන්වීමත් අපගේ මුඛ්‍ය පරමාර්ථයක් විය.

එපමණකින් පමණක් නොනැවතී පාසල් හැරගිය සිසුන් ඉලක්ක කරගනිමින් විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන් සඳහා පිවිසීමට නව මංපෙත් විවර කර දීම සඳහා විවිධ වූ වෘත්තීය පුහුණු වැඩසටහන් ග්‍රාමීය හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී. ඒ අනුව 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන නමින් අ. පො. ස. සාමාන්‍ය පෙළ අසමත් වූ දරු දැරියන් ඉලක්ක කරගනිමින් ඔවුන්ට වෘත්තීය පුහුණුව ලබා දීමේ වැඩසටහනක්ද පාසල් මට්ටමින් සිදු කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාවේ ඇතැම් බොහෝ ප්‍රදේශ මුහුණදෙන විශාලතම අභියෝගයක් වන අලි මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා වන අලි වැට ක්‍රමවත්ව සහ නිසිපරිදි නඩත්තු කිරීම සඳහා ''අලි වැට නඩත්තු සහයකයින්" පුහුණු කිරීමේ වැඩසටහන දියත් කරන ලදී. එමඟින් රැකියා විරහිත තරුණ පරපුරට නව රැකියා අවස්ථා උදා කිරීම මෙන්ම ඔවුන් බහුවිධ නිපුණ ශිල්පියෙකු බවට පත් කිරීමත්, එමෙන්ම වනජීවී සංරක්ෂණය හා කළමනාකරණය යන අංශ වෙත අවධානය යොමු කිරීමටත් එමඟින් හැකිවිය.

සෞභාග්‍යයේ දැක්ම කරා යන ශ්‍රී ලංකාවේ නව සංවර්ධන වැඩපිළිවෙල උදෙසා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙහි ක්‍රියාකාරකම් වල ප්‍රගතිය 2021 වාර්ෂික වාර්තාව මඟින් විදහා දැක්විය හැක.

ඉතාමත් තරඟකාරී පරිසරයක් තුළ හා පැවති කොරෝනා වසංගත තත්ත්වය තුළ විවිධ දුෂ්කරතා වලට සාර්ථකව මුහුණ දෙමින් අප අධිකාරියේ අරමුණු සහ කාර්යභාරයන් සඵල කර ගැනීමට හැකි වූයේ අපගේ කාර්ය මණ්ඩලයේ නොමඳ කැපවීම නිසාවෙනි.

ඉහත අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් ආයතනයේ අභිවෘද්ධිය සඳහා කැපවුණු සහ සහාය දුන් කාර්යමණ්ඩලයේ සියළු දෙනාටත්, අපගේ ආධුනිකයන් හට පුහුණු අවස්ථා ලබා දෙමින් හා නන් අයුරින් සහාය වූ රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සැමටත් ස්තූති කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

තරංග නලීන් ගම්ලත්
සභාපති

සංඥාපනය

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය අනුව අධිකාරිය විසින් වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතුව ඇත.

මෙම වාර්තාවේ කොටස් 03ක් අඩංගු වන අතර පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ විස්තර, පුහුණුව සම්බන්ධව සංවර්ධන කටයුතු සහ වර්ෂයට අදාළ සංක්ෂිප්ත වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාවෙහි ඇතුළත් තොරතුරු අන්තර්ගතකොට මෙම වාර්තාව පිළියෙල කර ඇත.

2021 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කාර්යාල 25 හි කළමණාකරුවන් හා ජාතික ආයතන වල ආයතන ප්‍රධානීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි ඒ ඒ අංශයන්හි අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කොට ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර සංක්ෂිප්තව මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලදී.

සැලසුම් හා අධීක්ෂණ අංශය

2021

දැක්ම

මානව සම්පත් සංවර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ
සමෘද්ධිය සැලසීම සඳහා සාර්ථක දායකත්වයක් දෙමින්
කාර්යක්ෂම පුහුණු කිරීමේ ආයතනය බවට පත්වීම

මෙහෙවර

කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා
සපුරාලනු පිණිස මනාසේ සකසන ලද උසස්ම වෘත්තීය
මට්ටමේ නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් තරුණ
තරුණියන් හට වෘත්තීය හා කාර්මික පුහුණුව ලබා දීම

අධිකාරියේ අරමුණු

සංස්ථාපිත කිරීමේ පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ.

(අ) වෘත්තීය පුහුණුව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ලබාදීම.

(ආ) වෘත්තීය පුහුණුවට අදාළ පුහුණු සම්මතයන් නිශ්චය කිරීම.

(ඇ) වෘත්තීය පුහුණුවට අදාළව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රදානයන් නිකුත් කිරීම.

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණය පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම.

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම.

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු කොමිෂන් සභාවට උපදෙස් දීම.

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාළ කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

අධිකාරියේ ප්‍රධාන කාර්යයන් / වැඩසටහන්

(අ) රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ලබාදීම, ජාතික ආයතන 03ක් සහ දිවයිනපුරා පිහිටුවා ඇති ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණුව ලබාදීම.

(ආ) වෙනත් වෘත්තීය පුහුණුවන්නන් සඳහා විවිධ ආයතන වලට යොමුකොට කාර්යස්ථ පුහුණුව ලබාදීම.

(ඇ) මොරටුව, පේරාදෙණිය සහ රුහුණු විශ්ව විද්‍යාලයන්හී ඉංජිනේරු උපාධි අපේක්ෂක සහ අනෙකුත් ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර පුහුණුව ලබාදීම.

(ඈ) අවිධිමත් ලෙස නිපුණතාව ලැබූ කර්මාන්ත ශිල්පීන්ට පෙර ඇගයීම් ක්‍රමයට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබාදීම, වෘත්තීයට අදාළ පරිදි සුදුසුකම් සහතික ලබාදීම සහ අදාළ ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුකරුවන් පුහුණු කිරීම.

(ඊ) පාසල් සිසුන්, පාසල් හැරගිය සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.

හැඳින්වීම

මෙහෙයුම් ව්‍යූහය

1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත විය.

තම කාර්යභාරයන් නිසි ලෙස ඉටු කරමින් අභිමානවත් 50 වසර පසු කරන අප අධිකාරියේ 1971 සිට 2021 දක්වා වෘත්තීය පුහුණු කිරීම් ක්ෂේත්‍රය තුළ පැමිණි ගමනට විශාල ශක්තියක් එක් කළ අංශයන් පිළිබඳ බිඳක් දැක්වීමට කැමැත්තෙමු.

1. පුහුණු අංශය

බඳවාගැනීම් අංශය, පුහුණු කිරීම් අංශය, යන්ත්‍රාගාර පුහුණු අංශය, කාර්යස්ථ පුහුණු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත පුහුණු අංශය දිස්ත්‍රික්ක 25 හරහා සමස්ත ශ්‍රී ලංකාව පුරා පුහුණු කටයුතු සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පවත්වාගෙන යාම යන අරමුණු සාක්ෂාත් කිරීමට උරදෙමින් කටයුතු කරයි.

2. තත්ත්ව අංශය

විෂයමාලා සංවර්ධන අංශය, තත්ත්ව කළමනාකරණ අංශය, ජාතික වෘත්තීය පරීක්ෂණ අංශය, ජාතික වෘත්තීය සුදුසුකම් අංශය, ඇගයීම් අංශය, සහතික අංශය යන ප්‍රධාන අංශයන්ගෙන් සමන්විත තත්ත්ව අංශය පුහුණු අංශයේ පුහුණු කටයුතු වඩාත් ක්‍රමවත්ව සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය සම්පත් සංවර්ධනය කරමින්, ආධුනිකයන්ගේ සහ ආයතනයේ ගුණාත්මක භාවය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සම්පාදනය කරමින් අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමට විශාල ශක්තියක් ලබාදේ.

3. සැලසුම් හා අධීක්ෂණ අංශය

සියලු දිස්ත්‍රික් කාර්යාල, ජාතික ආයතන, පරිපාලන, තත්ත්ව, මූල්‍ය හා පුහුණු යන සියලුම අංශයන් ආවරණය කරමින් ඔවුන්ගේ ප්‍රගතියන් දත්ත කළමනාකරණ පද්ධතිය හරහා ලබා ගනිමින් මාසික ප්‍රගති වාර්තා, කාර්තුමය වාර්තා, වාර්ෂික වාර්තා සහ අවශ්‍යතාවය අනුව අනෙකුත් වාර්තා ජනනය කරමින් රේඛීය අමාත්‍යංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට අවශ්‍ය පරිදි තොරතුරු ලබා දෙමින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය බාහිර පරිසරය සමඟ සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

තව ද අධිකාරියේ කටයුතු නිසි පරිදි මෙහෙය වීම සඳහා අවශ්‍ය සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අවශ්‍යතාව අනුව විවිධ ආකාරයෙන් සැලසුම් සකස් කිරීම ප්‍රධාන වගකීම වේ. එමෙන්ම අධිකාරියේ පුහුණු හා පුහුණුව සම්බන්ධ අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමද මෙම අංශය මගින් ඉටු කරනු ලබයි. තවද පුහුණුවට සියලුම තොරතුරු සහ සේවකයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමට අදාළ කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළියෙල කිරීමේ හා පරිපාලනය කිරීමේ කටයුතු ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයභාරයකි.

4. පරිපාලන අංශය

නිලධාරීන් බඳවාගැනීම් අංශය, ප්‍රවාහන අංශය, ඉදිකිරීම් හා නඩත්තු අංශය, නීති අංශය, නිලධාරී පුහුණු අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත අතර, මානව සම්පත් හා අනෙකුත් භෞතික සම්පත් කාර්යක්ෂම ලෙස පාලනය හා උපයෝජනය කරමින් ආයතනයේ ඉදිරි ගමනට දැවැන්ත ශක්තියක් ලබාදේ.

5. මූල්‍ය අංශය

ප්‍රසම්පාදන අංශය, ගබඩා අංශය, ගෙවීම් අංශය, වැටුප් අංශය සහ පොත් තැබීම් අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත වන අතර වාර්ෂිකව සැලසුම් අංශය මඟින් පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් අනුව පිළියෙල කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය නිසි අයුරින් මෙහෙයමින් ආයතනයෙහි සියලු කටයුතු සඳහා සජීවී බවක් එක් කිරීමට ප්‍රධාන දායකත්වය ලබාදේ.

6. විගණන අංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව, රේඛීය අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරයි. අභ්‍යන්තර පාලනය සහ ආයතනයේ කටයුතු වල විනිවිදභාවය විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය සහ කළමනාකාරීත්වයට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් විශාල මෙහෙයක් ඉටු කරනු ලැබේ.

මෙහෙයුම් ක්‍රියාවලිය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලැබී ඇති බලතල අනුව එම පනතෙහි අංක 37(1) දරන ඡේදයේ ප්‍රකාරව සකස් කළ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අධිකාරිය තම මෙහෙයුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සඳහා පුහුණු සංකල්ප යටතේ ජාතික ආයතන 03ක්, දිස්ත්‍රික් කාර්යාල 25ක්, පුහුණු අනුබද්ධ ආයතන හා අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශ දායක කරගත් කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබාදීම සිදු කරයි.

පුහුණුව සඳහා බඳවා ගැනීම, සුපරීක්ෂණය, අධීක්ෂණය, සහතිකකරණය ආදී අංශ ගණනාවක් යටතේ සෘජුවම පුහුණු මෙහෙයුම් කටයුතු සිදු වේ. ඊට අමතරව කළමනාකරණය හා පරිපාලනය, සේවක පුහුණුව, යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍ය හා විගණනය ඊට ඇතුලත් වේ.

2021....

කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	13,979
රැකියාස්ථ පුහුණුව	6,690
විශේෂ කර්මාන්ත පුහුණුව	5,439
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව	2,905
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව (අර්ධ කාලීන)	393

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වන අප, දැයේ තරුණ දූ පුතුන් හට වෘත්තිය හා කාර්මික පුහුණුව ලබා දීම තුළින් ඔවුන්ගේ අනාගත රැකියා සිහිනය මල්ඵල ගැන්වීම සඳහා නව මංපෙත් විවර කර දීමේ කාර්යභාරයයෙහිලා 2021 වසර වන විට දී අඩසියවසකට ආසන්නව එනම්, 50 වසරක අභිමානවත් වූ ගමන් මගක් සනිටුහන් කරනු ලබයි.

Covid-19 වසංගත තත්ත්වය හමුවේ වුවද, සියලු අභියෝගයන් වලට සාර්ථකව මුහුණ දෙමින්, මානව සම්පත් සංවර්ධනය කිරීම තුළින්, දැනුම් කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැඟීම තම ප්‍රධානතම අරමුණු අතරට එක් කරගත් අතිගරු ජනාධිපතිතුමන්ගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය හා සමගාමීව, අඩු ආදායම්ලාභී පවුල් 100,000ක් උදෙසා රැකියා අවස්ථා ලබාදීම අරමුණු කරගනිමින් බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය සමඟ එක්ව රැකියා අපේක්ෂිත තරුණ දුවා දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමේ සුවිශේෂ කාර්යභාරය සමඟින් 2021 වර්ෂය තුළදී අප ආයතනය විසින් ඉටු කරනු ලැබූ කාර්යභාරයන් මෙලෙසින් දිගහැරෙන වගයි.

NAITA SRI LANKA වෙබ් ගුවන් විදුලි චැනලය ආරම්භ කළ අතර ඒ තුළින් ද විවිධ වූ වෘත්තින් සඳහා විෂයානුබද්ධ කරුණු ඇතුළත් වන සාකච්ඡාමය වැඩසටහන් විකාශනය කරනු ලබයි. එමෙන්ම එම ගුවන් විදුලි වැඩසටහන ආධුනිකයින් සඳහා වෘත්තිය මඟ පෙන්වීම් පෞරුෂ සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීම අරමුණු කරගනිමින් ආරම්භ කරන ලදී.





රටේ පැවැති කොවිඩ් වසංගත තත්වය යටතේ පුහුණු කටයුතු නොකඩවා පවත්වා ගෙන යෑම සඳහා, බඳවා ගෙන ඇති ආධුනිකයින් සඳහා මාර්ගස්ථ ක්‍රමය යටතේ වැඩසටහන් 26ක් මෙමඟින් පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා දිස්ත්‍රික් කාර්යාල හා ජාතික ආයතන තුනෙහිම ආධුනිකයින් 3461ක් සහභාගි වේ.

ජාත්‍යන්තර ප්‍රමිතියෙන් සහ පිළිගැනීමෙන් යුත් සුහුරු තාක්ෂණවේදීන් (Smart Technocrats) නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය වඩාත් අවධාරණය කර පෙන්වන රජයේ සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්තියට අනුගත වෙමින් නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය ද මඟපෙන්වීම මත අප අධිකාරිය විසින් නවීන අංගෝපාංග සහිත අංග සම්පූර්ණ ශාලිකා මැදිරියක් ස්ථාපිත කර ඇත.

මේ තුළින් අප අධිකාරිය යටතේ පුහුණුව ලබන ආධුනිකයන් සඳහා ඩිජිටල් ඉගෙනුම් සම්පත් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය වඩාත් සාර්ථකව නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිත කරමින් සිදුකිරීමට හැකියාවක් ලැබී ඇත. මේ දක්වා විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන් වල ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගෙනුම් සම්පත් නිර්මාණය කර ඇති අතර ආධුනිකයන් ඒවායින් නිසි ඵල ලබා ගනිමින් සිටී.





එමෙන්ම ආධුනිකයන් සඳහා ගුණාත්මක රසවින්දනයක් සමඟම අධ්‍යපනයද ලබා දීමේ අරමුණෙන් ස්ථාපිත කරන ලද naitavoice වෙබ් ගුවන් විදුලියද මේ වන විට පැය 24 පුරා ක්‍රියාත්මක ගුවන් කාලයක් සහිතව විකාශනය වන අතර නිත්‍ය ග්‍රාහක සංඛ්‍යාව 500ද ඉක්මවා ඇත. ගුවන් විදුලිය බාධාවකින් තොරව ශ්‍රවණය කිරීමේ පහසුව සඳහා Android App එකක්ද හඳුන්වා දී තිබේ.

NAITA Sri Lanka

http://www.naitavoice.com/

එමෙන්ම, සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්තිය යටතේ අධ්‍යාපනය තුළට ඩිජිටල් අධ්‍යාපන ක්‍රමවේදය ගෙන ඒමේ සංකල්පය මත ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් ආධුනිකත්ව පුහුණුව ලබන සිසුන් සඳහා ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට සහයෝගය ලබාදීම වස් නිර්මාණය කරන ලද නයිටා ඩිජිටල් ඉගෙනුම් ඇකඩමිය ආරම්භ කිරීම සනිටුහන් කිරීම සඳහා අප අධිකාරිය යටතේ හෝටල් ක්ෂේත්‍රයේ මූලික පාඨමාලාව සඳහා තෝරා ගත් ආධුනික කණ්ඩායම ගරු අමාත්‍යතුමිය විසින් නයිටා ඩිජිටල් ඉගෙනුම් ඇකඩමිය සඳහා ඩිජිටල් ක්‍රමවේදය භාවිතයෙන් ලියාපදිංචි කිරීම සිදුකරන ලදී.

ඉහළ චේතන සහ සමාජ ගරුත්වය හිමි සමාජ ජීවිතයක් ගත කරන නව නිපුණතා ශ්‍රම බලකායක් බිහිකිරීම අරමුණු කොට ගත් වත්මන් රජයේ සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්තිය අනුව ගමට තාක්ෂණය ගෙන යාම ප්‍රධාන ඉලක්කයකි. නවීන තාක්ෂණය ගමට ප්‍රවිෂ්ඨ කරවීම සඳහා ගරු රාජ්‍ය අමාත්‍යතුමියගේ මඟපෙන්වීම මත නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් දියත් කරන ලද ජංගම පුහුණු ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ නිර්මාණ කාර්යයක් ලෙස මුල්ම ජංගම පුහුණු ඒකකය විද්‍යුත් සහ විදුලි ක්ෂේත්‍රයට අදාළව නිර්මාණය විය. වෘත්තීය පුහුණුවේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සනිටුහන් වන මේ ජංගම ව්‍යාපෘතිය තුළින් නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශ වලට පමණක් සීමා වී තිබූ නවෝත්පාදනයන් යුත් තාක්ෂණය දුර බැහැර ගම් දනව් කරා රැගෙන ගොස් වඩා පුළුල්ව සමාජගත කිරීමට අවස්ථාවක් සැලසී ඇත.

දිනෙන් දින ශ්‍රම වෙළඳපොළට එක්වන නිපුණ ශ්‍රම බලකායට නව තාක්ෂණය සමඟ ගැටෙමින් සිය රැකියාවල නිරත වීමට අවැසි පරිසරය සකසා දීම, තාක්ෂණික වෘත්තීන් කෙරෙහි තරුණ ප්‍රජාවේ අවධානය සහ ආකර්ෂණය ලබාගැනීම සහ නිපුණ සහනික ලබාදීමේදී නව තාක්ෂණික කොටස් ගැන විධිමත් ඇගයීම් පහසුකම් සැපයීම, මෙම ජංගම පුහුණු ව්‍යාපෘතියේ අපේක්ෂාවන් වේ. තවද, සේවා යෝජකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට හැකිවීම, සේවාලාභීන්ට වඩා ඵලදායී

කාර්යක්ෂම සේවාවක් ලබාදීමට හැකි වීම, ග්‍රාමීය ප්‍රජාව තුළ ආර්ථික සංවර්ධනය වේගවත් වීම, නගරයත් ගමත් අතර ඇති තාක්ෂණික දැනුම් පරතරය අවම වීම මෙමඟින් අත්පත් වන ප්‍රතිලාභ ලෙස සඳහන් කළ හැකිය.





ශ්‍රී ලංකා යුධ හමුදාවේ විවිධ කාර්යභාරයන් වල නිරත වන හමුදා සෙබළුන්, ඵලදායී වෘත්තීය බලකායක් බවට පත් කිරීමේ ජාතික කර්තව්‍යයට උරදුන්, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් එහි පළමු අදියරේදී, ඉංජිනේරු සේවා බලකායේ සෙබළුන් 800 දෙනෙකු සඳහා මධ්‍යස්ථාන පහකදී NVQ-RPL ඇගයීම් පවත්වන ලද අතර ඒ අනුව, ඔවුන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් NVQ III වන මට්ටමේ සහතික පිරිනමන ලදී.





අප අධිකාරිය සහ එස්-ලෝන් එක්ව සමාජයේ සිටින නිපුණත්වයෙන් යුත්, එහෙත් නිසි පරිදි සහතිකකරණයට ලක්නොවූවන් ලෙස හඳුනා ගත් ජලනල කාර්මිකයන් සඳහා ඔවුන්ගේ තාක්ෂණික හැකියාව සහ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙමඟින් ශ්‍රම වෙළඳපොළට අත්‍යවශ්‍ය වන නිපුණ මිනිස්බල සංවර්ධනයට ඉමහත් ප්‍රතිලාභයක් සැපයෙන අතර අනාගතයේ දී පුද්ගලයන්ගේ ගෞරවය හා සමාජ තත්ත්වය වැඩිදියුණු කරනු ඇත.

වෘත්තීය පරීක්ෂණ සංවිධානය කිරීම, පැවැත්වීම සහ සහතික නිකුත් කිරීම ජාතික වෘත්තීය පරීක්ෂණ යටතේ (National Trade Testing - NTT) හෝ ජාතික වෘත්තීය සුදුසුකම් යටතේ (National Vocational Qualifications - NVQ) සහ පූර්ව ඉගෙනීම පිළිගැනීමෙන් (Recognition of Prior Learning - RPL) සිදු කෙරෙනු ඇත. මේ යටතේ හඳුනා ගත් ජලනල කාර්මික ශිල්පීන් 1000 ක් වාර්ෂිකව සහතිකකරණයට ලක්කිරීමට අපේක්ෂා කෙරේ.

පුහුණුව ලත් හෙද සහ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලයේ විශාල හිඟයක් පවතින පෞද්ගලික අංශයේ රෝහල් සහ හෙද නිවාස සඳහා වාර්ෂිකව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ පරමාර්ථය ඇතිව අප අධිකාරියත් පෞද්ගලික රෝහල් සහ සාත්තු නිවාස සංගමයත්, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවත් අතර මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වීමට නොහැකි වූ හා පාසල් හැරගිය පිරිස් වලට රැකියා නිපුණතාවය ලබා ගැනීමට ද මෙය ඉවහල් වේ. මේ අනුව, හෙද සහ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලයේ 950ක් වාර්ෂිකව පුහුණු කිරීමට ද අපේක්ෂා කෙරේ.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ INSEE සිමෙන්ති සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම අධිකාරියේ සභාපති තරංග නලින් ගම්ලත් මැතිතුමාගේ සහ



INSEE සිමෙන්ති සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ගුස්ටාවෝ නවාරෝ මහතාගේ ප්‍රධානත්වයෙන් INSEE සිමෙන්ති සමාගමේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම ගිවිසුම මඟින් වෑද්දුම් ශිල්පී අවුරුදු 1½ සහ විදුලි ශිල්පී අවුරුදු 1½ යන පාඨමාලා දෙක ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සෞභාගයේ දැක්ම සංකල්පය අනුව ආකල්ප කුසලතා දැනුම සමඟින් නිපුණතා සංවර්ධනයෙන් සපිරි දේශයක් ගොඩනැගීමේ අරමුණ පෙරදැරි කරගෙන "SKILLS SRI LANKA" වැඩසටහන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සහභාගීත්වයෙන්, නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මහත්මියගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලදි.



"SKILLS SRI LANKA" ව්‍යාපෘතිය යටතේ දැනට පවතින තාක්ෂණ විද්‍යාල තාක්ෂණයෙන් දියුණු කිරීම අරමුණු කර ගනිමින් "Tech උදාන" ව්‍යාපෘතිය ආරම්භ කළ අතර ඊට සමගාමීව වෘත්තීය පුහුණුව හදාරන දරු දැරියන්ට මාසිකව රු 4000 ක ශිෂ්‍යාධාර ලබාදීම, ජංගම වෘත්තීය පුහුණුව බල ගැන්වීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම, රැකියා සුරක්ෂිතතාවය සඳහා රාජ්‍ය පෞද්ගලික ආයතන සමඟ අවබෝධතා වලට එළැඹීම, වෘත්තීය පුහුණුව ලබන සියලුම සිසුන් සඳහා නොමිලේ ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් (Overall Kit) යන ව්‍යාපෘතින් ආරම්භ කරන ලදි.

දිවයින පුරා විසිරී සිටින විදුලි ශිල්පීන් 40,000කට සහ ජලනල කාර්මික ශිල්පීන් 10,000කට පෙර දැනුම ඇගයීමේ ක්‍රමය යටතේ (RPL) ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සහතික කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) ලබාදීම උදෙසා අප අධිකාරියත් මහජන උපයෝගිතා කොමිෂන් සභාවත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවත් අතර ත්‍රෙපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.



එමෙන්ම, උසස් තාක්ෂණික දැනුමෙන් යුතු විදුලි සංදේශ තාක්ෂණික ශිල්පීන් දෙස් විදෙස් ශ්‍රම වෙළඳ පොළට දායාද කිරීම උදෙසා Huawei Lanka Technology සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබන ලදී.



ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ JAT Holdings ආයතනය එක්ව දිවයින පුරා විසිරී සිටින දැව පින්තාරු ශිල්පීන්ට NVQ මට්ටමේ සහතිකයක් ලබාදීම සඳහා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය ගරු සීතා අරඹේපොළ මැතිණියගේ ප්‍රධානත්වයෙන් JAT Holdings ශ්‍රවණාගාරයේදී අවබෝධ ගිවිසුමක් අත්සන් තබන ලදී.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සිය 50 වැනි වර්ෂ පූර්ණය 2021.12.16 දින සමරන ලදී. පුරා වසර 50 ක් ජාතියේ දුවා දරුවන් උදෙසා ආධුනිකත්ව පුහුණුව ලබා දී

ඔවුන් නිපුණ ශිල්පීන් ලෙස දෙස් විදෙස් ශ්‍රම බලකායට දායාද කිරීමේ උදාරතර ජාතික මෙහෙවරට උරදෙමින් අප ආයතනය පැමිණි ගමන් මඟ සැමරීම සඳහා වැඩසටහන් කිහිපයක්ම ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ සංවිධානය කරන ලදී. පවතින කොවිඩ් වාතාවරණය හේතුවෙන් මෙම සංවත්සර උළෙල ඉතා චාම් අයුරින් එහෙත් අභිමානවත්ව පවත්වන ලදී.

භික්ෂූන් වහන්සේලා 25 නමක් විෂයෙහි සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම ප්‍රධානතම වැඩසටහන ලෙසින් පැවත්වුණු අතර නයිටා 50 වැනි වසර සංකේතවත් කෙරෙන සමරු ඵලකයක් විවෘත කිරීම, අධිකාරියේ සභාපති තරංග නලීන් ගම්ලත් මැතිතුමාගේ සුරතින් සිදුවිය. උදෑසන NAITA Web රේඩියෝව ඔස්සේ දිස්ත්‍රික් කළමනාකරුවන්, ආධුනිකයන් හා ව්‍යවසායකයින් සහ සම්බන්ධ කර ගනිමින්, ආයතනයේ විවිධ සේවාවන් සහ කාර්යභාරයන් පිළිබඳව හඳුන්වාදෙමින් සජීවී සාකච්ඡාමය වැඩසටහනක් ද විකාශය කරන ලදී.





ආයතනික තොරතුරු


දිස්ත්‍රික් කාර්යාල හා ජාතික ආයතන
ප්‍රධාන කාර්යාලය
දිස්ත්‍රික් කාර්යාල
ජාතික ආයතන
යාපනය
කිලිනොච්චිය
මන්නාරම
මුලතිව්
වවුනියාව
තිකුණාමලය
අනුරාධපුරය
පොළොන්නරුව
පුත්තලම
මාතලේ
මඩකලපුව
කුරුණෑගල
මහනුවර
කුලුනායක
කෑගල්ල
අම්පාර
ගම්පහ
බදුල්ල
නුවරඑළිය
මොණරාගල
ඔරුගොඩවත්ත
කොළඹ
ප්‍රධාන කාර්යාලය
කටුබැද්ද
කළුතර
රත්නපුරය
ගාල්ල
හම්බන්තොට
මාතර

	ප්‍රධාන කාර්යාලය 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය. දු.ක. 011-2888782 - 7
01	**ඉංජිනේරු තාක්ෂණික ආයතනය** 18 කණුව, පන්සල පාර, කටුනායක. දු.ක. 011-2252833
02	**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය** නො. 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව. දු.ක. 011-2647393, 011-2643847
03	**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය** නො. 69-ඒ, බෙස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. දු.ක. 011-2572977
	අම්පාර දිස්ත්‍රික් කාර්යාලය නො. 06, ජී. එස්. පටුමග, කල්මුණායිකුඩි 13, කල්මුණේ. දු.ක. 067-2229357
	අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ගුවන් තොටුපල මාවත, අනුරාධපුරය. දු.ක. 025-2223178
	බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය 4/10, මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල. දු.ක. 055-2230644
	මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය නො.16/1, නව කල්මුණේ පාර, මඩකලපුව. දු.ක. 065-2228130
	කොළඹ දිස්ත්‍රික් කාර්යාලය නො. 242, හැව්ලොක් ටවුම, කොළඹ 05. දු.ක. 011-2587258, 011-2597671
	ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය නො. 393, වක්වැල්ල පාර, ජූල්ගහ, ගාල්ල. දු.ක. 091-2235628
	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය නො.61/5, මීනුවන්ගොඩ පාර, ගම්පහ. දු.ක. 033-2232874
	හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය නො.39, පල්ලික්කුඩාව පාර, තංගල්ල. දු.ක. 047-2241512
	යාපනය දිස්ත්‍රික් කාර්යාලය නො. 44, සෝමසුන්දරම් ඇවිනිව්, චුන්දිකුලි, යාපනය. දු.ක. 021-2222383
	කළුතර දිස්ත්‍රික් කාර්යාලය 326/2, 3 වන මහල, කෙළින් වීදිය,ගාලුපාර, කළුතර දකුණ. දු.ක. 034-2224239

	මහනුවර දිස්ත්‍රික් කාර්යාලය 108/2/බී, තිවංක බෝධි මාවත, මහනුවර. දු.ක. 081-2201918
	කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය බණ්ඩාරනායක මාවත, බල්ලපාන, ගලිගමුව. දු.ක. 035-2284931
	කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලය නුවර පාර,අනදපුරම්, කිලිනොච්චිය. දු.ක. 0343942824
	කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල. දු.ක. 037-2223789
	මාතර දිස්ත්‍රික් කාර්යාලය නො. 27 ඒ, විවෘත විශ්ව විද්‍යාල පාර, නුපේ, මාතර. දු.ක. 041-2226958
	මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය 952/1, නල්ලයාර් වීදිය, පරණ මූර් වීදිය, මන්නාරම. දු.ක. 023-2223404
	මාතලේ දිස්ත්‍රික් කාර්යාලය නො.11, පන්සල පාර, මණ්ඩන්ඩාවල, මාතලේ. දු.ක. 066-2223173
	මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය උසාවි සංකීරණය, මොණරාගල. දු.ක. 055-2276504
	මූලතිව් දිස්ත්‍රික් කාර්යාලය මාන්කුලම් පාර,මුල්ලියාවෙලෙ, මූලතිව්. දු.ක. 021-2061012
	නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය නො. 116, කෝවිල් පාර, හාවාඑළිය, නුවරඑළිය. දු.ක. 052-2223702
	පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය නො. 103, වාරිමාර්ග පෙදෙස, නවනගරය, පොළොන්නරුව. දු.ක. 027-3223023
	පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය මෝලවත්ත, මැදගම පාර, මාදම්පේ. දු.ක. 032-2248250
	රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය නො. 642, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර. දු.ක. 045-2228667
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය නො.103/7, තැපැල් කාර්යාලය පාර, ත්‍රිකුණාමලය. දු.ක. 026-2226569
	වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය ඕෆ් පාර්ක් පාර, වවුනියාව. දු.ක. 024-2224679

02. පාලක මණ්ඩලය

1. තරංග නලීන් ගම්ලත් මහතා,
   සභාපති,
   ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
   971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
   - Reading for, Doctor of Business Administration (2021/24)
   - Master of Business Studies (2015)
   - Bachelor of Commerce (2007)
   - Certifies Business Accountant (2015)
   - Certified Course in Computer Based Accounting

2. මහාචාර්ය මහින්ද රූපසිංහ මහතා,
   උප සභාපති
   ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
   971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,වැලිකඩ, රාජගිරිය.
   - PhD in Gemology and Geochemistry
   - MPhil in Geology and Mineralogy
   - BSc in Geology and Hydrogeology
   - German Language

3. ජේ.ඒ.ඩී.ජේ.ජයලත් මහතා (2021.03.25 දක්වා)
   තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
   අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

   ආචාර්ය කේ.ඒ.ලලිතධීර මහතා, (2021.04.30 සිට)
   තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
   අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
   - PhD, Degree in Economics (2017)
   - Master of Arts in Economics (2002)
   - Bachelor of Arts Special Degree in Economics (1993)

4. එස්.පී.ශ්‍රියාකාන්ති මිය (2021.11.05 දක්වා)
   ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ
   දෙපාර්තමේන්තුව
   මුදල් අමාත්‍යාංශය
   ලේකම් කාර්යාලය
   කොළඹ 01

   එම්.ඒ.එස්.මධුශංක මහතා (2021.11.05 දින සිට)
   රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
   මහා භාණ්ඩාගාරය
   මුදල් අමාත්‍යාංශය
   ලේකම් කාර්යාලය
   කොළඹ 01
   - Postgraduate Diploma in Developing Economics
   - Postgraduate Diploma in Applied Statistics
   - Bachelor of Science
   - Diploma in Public Administration

5. හසිත ඒකනායක මහතා
   අංක 79/5, මොරගහමුල,
   මැදමහනුවර,
   මහනුවර.
   - BSc General Degree in Industrial Mathematics and Computer Sciences

6. මොහොමඩ් මික්දාඩ් මහතා
   අංක 89/2, දෙහිවල පාර
   පැපිලියාන
   බොරලැස්ගමුව
   - Bachelor of Business Administration (Special) (1993)
   - Completed Preliminary Examination Institute of Chartered Accountants of Sri Lanka

7. ජානක කමල්ගොඩ මහතා
   අංක 136 1/2, පැරණි කැස්බෑව පාර
   ගංගොඩවිල
   නුගේගොඩ
   - Master of Business Studies (Merit)
   - Postgraduate Diploma in Education
   - Postgraduate Diploma in Counseling
   - Postgraduate Diploma in Business Management

8. එස්.කේ.වයි.පී.එස්.කේ.සෙනරත් මහතා
   අංක 309, කොළඹ පාර
   ගම්පහ.
   - Attorney-at-Law
   - Diploma in Journalism
   - Diploma in Archaeological Heritage

9. එස්.ඒ.ඩී.තිලක් ප්‍රේමලාල් මහතා,
අංක 123/1ඒ, දුම්රියපොළ පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

- Certificate Course in Quality Survey
- Certificate Course in Construction Management for Technical Officers
- G.C.E. (A/L) Examination

10. සහන් ද සිල්වා මහතා,
අංක 1009/18, 8 වැනි පටුමග,
සුමුදු මාවත,
මාලඹේ.

11. ක්‍රිෂාන් සියඹලාපිටිය මහතා,
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, සමාජ පිරිසිදුකම සහ අපද්‍රව්‍ය කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය,
ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.

- Professional Qualification Human Resource Management (PQHRM)
- Master of Business Administration
- LLB Degree graduated in 2016

12. ජේ.සී.කේ.බස්නායක මහතා (2021.01.27 දක්වා)
අංක 2/ඒ/25, ජයවඩනගම,
බත්තරමුල්ල.

ඩබ්ලිව්.වී.පී.විජේසිරි මහතා (2021.03.16 දින සිට)
අංක 03, සෞභාග්‍ය උද්‍යානය,
කොහිලකොරටුව පාර,
මහරගම.

- Certificate in Business Management
- General Certificate in Education Advanced Level

13. ගයාන් මේනක දිසානායක මහතා
(2021.01.27 දක්වා)
අංක 82/1, අරලිය උයන,
"සේනාර", පල්ලේගම,
ඇඹිලිපිටිය.

බී.ප්‍රියංගිකා සිගේරා මෙනවිය (2021.03.16 සිට)
අංක 25/1, චන්ද්‍රා වෙත්තසිංහ මාවත,
කොස්වත්ත පාර,
නාවල.

- Writing for BA Early Childhood Education (Last Semester)
- Diploma in Psychology and Counselling
- Diploma in Montessori Method of Education with Distinction

14. ලක්සෙන් අබේගුණසේකර මහතා
(2021.01.27 දක්වා)
අංක 524, අබේසීර්,
ගෝනවල, කැලණිය.

ඩී.එම්.නිරන්ජන් දිසානායක මහතා
(2021.03.16 දින සිට)
අංක 126/4ඒ, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

- General Certificate in Education Advanced Level
- Certificate in Marketing

15. රංග පෙරේරා මහතා (2021.02.15 දක්වා)
සතර ආයතනය,
මහරගම.

පී.සමන්ත කුමාර මහතා (2021.03.23 සිට)
කුඩිරිප්පුව,
ගල්මුරුව,
මාදම්පේ.

- Master of Science (Floriculture and Landscaping Architecture
- Diploma in Agriculture
- Diploma in Journalism
- Bachelor of Science (Plantation Management)

අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්

තරංග නලීන් ගම්ලත් මහතා	සභාපති
මහාචාර්ය මහින්ද රූපසිංහ මහතා	උප සභාපති
පී.ආර්. රොද්‍රිගෝ මහතා	අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
ආර්.එම්.ඒ.පී. සමරදිවාකර මහත්මිය	අධ්‍යක්ෂ (තත්ත්ව) 2021.11.23 දින විශ්‍රාම ගන්නා ලදී
සුමේධ ජයසිංහ මහතා	අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
ජී.එච්.වී.එන්.ඩබ්. ද සිල්වා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ (පුහුණු) වැ.බ. (2019.07.10 සිට මේ දක්වා)
එන්.ඩබ්.එන්. සඳමාලි මහත්මිය	අභ්‍යන්තර විගණක / අධ්‍යක්ෂ (මුදල්) රා.ඉ. (2020.06.11 සිට මේ දක්වා)
ටී.පී.කේ. පෙරේරා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව)
සී.පී. සුබසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) සහකාර අධ්‍යක්ෂ (නඩත්තු හා සිවිල්) (2021.09.27 - 2021.11.22) අධ්‍යක්ෂ (තත්ත්ව)වැ.බ. (2021.11.23 දින සිට මේ දක්වා)
එස්.වී.පී. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (ඇගයීම්)
ඩබ්.ඒ.කේ.එස්. කුමාර මහතා	සහකාර අධ්‍යක්ෂ (කාර්යස්ථ පුහුණු) / සහකාර අධ්‍යක්ෂ (විශේෂ කාර්මික පුහුණු) (2021.09.27 - 2021.11.22)
ඒ.ජේ. පතිරණ මහතා	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති)
එම්.එල්.පී. ප්‍රනාන්දු මහතා	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා අලෙවි)
ජී.පී. සුනිල් මහතා	සහකාර අධ්‍යක්ෂ (NSS)
ආර්.ඩබ්.එම්.ඒ.ජේ. රත්නායක මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)
යූ.එම්. ප්‍රබෝෂිනී මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා පාලන)
එන්.ඩී.පී. උස්ගොඩාරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා සැපයුම්)
ටී.එස්.පී.ඒ. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) (2021.11.01 දින ඉල්ලා අස්විය)
පී.එම්. විතානගේ මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පුහුණු සේවා)
ඒ.එච්.එස්.පී. විජේරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ)
එම්.එම්.පී. ප්‍රනාන්දු මහතා	පුහුණු කළමනාකරු/ සහකාර අධ්‍යක්ෂ(නඩත්තු හා සිවිල්) වැ.බ. (2021.09.01 දින ඉල්ලා අස්විය)
කේ.ඒ.එස්.එස්.ජයසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (විශේෂ කාර්යස්ථ පුහුණු)
පී.එස්.ඩබ්. දිසානායක මහතා	සහකාර අධ්‍යක්ෂ (පර්ෂද) (2021.10.01 දින සිට මේ දක්වා)
එච්.එම්.බී.ඒ.කේ.විජේරත්න මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (සහතික) (2021.11.01 දින සිට මේ දක්වා)
ඩී.ආර්. සපුතන්ත්‍රී මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති - IET
එච්.ඒ.එන්.ඩී. කුමාරි මහත්මිය	අධ්‍යක්ෂ/ විදුහල්පති - AETI / අංශ ප්‍රධානී (නඩත්තු හා සිවිල්) (2021.12.01 දින සිට)
ඩී.එල්.ඒ.කේ.දිසානායක මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති (වැ.ආ.) - AETI (2021.12.01 දින සිට මේ දක්වා)
එම්.එච්.එන්.පී.ධර්මසිරි මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති (වැ.ආ.) - IETI

දිස්ත්‍රික් කළමනාකරුවන්

එස්.ඩී.අබේවික්‍රම මහතා	-	හම්බන්තොට
ඒ. මසූර් මහතා	-	අම්පාර
ඩී.ඩී. පියලත් මිය	-	කෑගල්ල
එම්.ආර්.ඩී.ඒ.එස්.ගුණාරත්න මහතා	-	කොළඹ
යූ.එම්.කේ.නානායක්කාර මහතා	-	මාතර
පී.කේ.පී.ගුණාවර්ධන මහතා	-	බදුල්ල
පී. නාරන්ගොඩ මහතා	-	ගාල්ල
බී.එම්.ජේ.එස්.කේ. රණාරාජා මහතා	-	මාතලේ
එස්.ඒ.එම්.එස්.එම්. සලීම් මවුලානා මහතා	-	මඩකලපුව
එස්. වීනස් මහතා	-	මන්නාරම
එස්. සුබාෂ් මහතා (වැ.ආ.)	-	වව්නියාව
බී.ඒ.යූ.ඒ. කරුණාරත්න මහතා (2021.01.15 දින සිට විශ්‍රාම ගන්නා ලදී) ඕ.කේ.පී.ඒ.සමන් කුමාර මහතා (2021.01.15 දින සිට මේ දක්වා)	-	මහනුවර
පී.ටී. රත්නකුමාර මහතා (වැ.ආ.)	-	යාපනය
ජේ. උදයවර්ධන මහතා (වැ.ආ.) (2021.12.08 දින සිට විශ්‍රාම ගන්නා ලදී)	-	කුරුණෑගල
එස්.සිවගෞරි මිය (වැ.ආ.)	-	මුලතිව්
යූ.පී.එන්.සමීර මහතා (වැ.ආ.)	-	පොලොන්නරුව
එස්.පී.සී.ජේ. මෛත්‍රීදාස මහතා (වැ.ආ.)	-	මොණරාගල
කේ.පත්මනාදන් මහතා (වැ.ආ.)	-	ත්‍රිකුණාමලය
එච්.එම්.බී.ඒ.කේ.විජේරත්න මිය	-	කළුතර
වයි.එස්.පියතිලක මහතා (වැ.ආ.)	-	රත්නපුර
කේ.කේ.නිස්සංක මිය (වැ.ආ.)	-	ගම්පහ
ටී.එම්.ටී.බී.කරුණාරත්න මහතා (වැ.ආ.)	-	අනුරාධපුර
වයි.යෝකේස්වරන් මහතා (වැ.ආ.)	-	කිලිනොච්චි
ආර්.එම්.එන්.එස්.කේ.රත්නායක මහතා (වැ.ආ.)	-	පුත්තලම
ඩී.ඒ.ඩී.සූරියබන්ඩාර මහතා (වැ.ආ.)	-	නුවරඑළිය


National Apprentice & Industrial Training Authority
Organizational Structure
Board Of Management
Chairman /CEO
Vice Chairman
Director General
Institutes/
Districts
Director Admin. & H.R.
Director Training
Director Quality
Director Planning & Monitoring
Director Finance
Internal Auditor
I.A.O
A.D. Admin
VRU Officer
Proc. Officer
A.D. Maint.& Civil .
Tech. Officer
Trp. Officer
M.A.
Drivers
M.A.
A.D. HRM
A.O.
A.D. HRD
T.O.
Translator.
M.A.
M.A.
Drft.M. M.A.
M.A.
Office Aide
Office Aide
A.D. Training Service
A.D. Training
A.D. Cluster
A.D. SIT
A.D. OJT
A.D. C.G.& Marketing
A.D. Quality
A.D. NSS
A.D. Assesment
A.D. Certificate
A.D. Information Systems
A.D. Planning & Develop.
A.D. Monitoring
A.D. Acc. & Controll
T.O.
Inspec
Inspec.
Q.A. Off.
Sys. Adm
D.B Adm
Statician
Acct. Officer
Acct. Officer
Acct. Officer
B/ Sec Leg.Off
Book Keeper
Management Asst.
Management Asst.
Management Asst.
Office Aide
Office Aide
Office Aide

පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

පුහුණු ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව, ආයතනික පුහුණුව/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව, යන්ත්‍රාගාර පුහුණුව, කාර්යස්ථ පුහුණුව ලෙස වර්ග කළ හැකිය.

■ කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව

ආයතනය මඟින් පවත්වාගෙන යනු ලබන පුහුණු කටයුතු අතර ප්‍රධාන පුහුණු ක්‍රමවේදය මෙය වන අතර, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණු කිරීම් සඳහා අධිකාරිය ලත් ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වේ. මෙම පුහුණු ක්‍රමවේදයේදී පුහුණු වන්නන් පුහුණු කාලය තුළ වැඩ කරමින් ඉගෙන ගැනීම මඟින් අවශ්‍ය නිපුණතා ලබා ගන්නා අතර ඒ කර්මාන්ත සඳහා ඔහු හෝ ඇය අනුයුක්ත කරනු ලැබේ.

මෙහිදී පුහුණුලාභියා හට පහත ක්‍රමවේදයන් එකක් යටතේ පුහුණුව ලබා ගැනීමට හැකියාව ඇත.

i. කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව

ii. ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය

iii. ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව

iv. ග්‍රාමීය ආධුනිකත්ව පුහුණුව

■ කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව

එක් එක් ක්ෂේත්‍රයට විශේෂිත වූ ජාතික පුහුණු හා කර්මාන්ත උපදේශක කමිටුව (NITAC) මඟින් එක් එක් ක්ෂේත්‍රයන්ට පුහුණු සම්මතයන් පිළියෙලකොට එම පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණු කටයුතු සිදු කිරීමට කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් ආයතන වල ආධුනිකත්ව පුහුණුව ආරම්භ කළ හැකිය.

■ ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය (NVQ)

ආධුනිකත්ව පුහුණුව යටතේ වෘත්තීන් 51ක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. මෙම ක්‍රමයේ දී කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව ක්‍රමයෙන් කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් පුහුණු ආයතනවල පුහුණුව ආරම්භ කළ හැකිය. මෙම ක්‍රමය තුළ පුහුණු ආයතන /කර්මාන්ත තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ප්‍රතීතනය කිරීමට සිදු කළ යුතු අතර ආධුනිකයන් නිරන්තර ඇගයීමට ලක් කළ යුතුය. පුහුණුව අවසානයේ දී තෘතීයික හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ඇගයීම්කරුවන් විසින් අවසාන ඇගයීම් පරීක්ෂණය සිදුකර ඒ ඒ මට්ටම සඳහා සහතික නිකුත් කරනු ලැබේ.

■ ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව





මෙම පුහුණු ක්‍රමය යටතේ එක් එක් ප්‍රදේශයට ආවේණික වූ කර්මාන්තයෙහි පුහුණුව ලැබීමට ආධුනිකයින් යොමු කරන අතර අදාළ පුහුණු සම්මතයන් අදාළ ආයතනය හා අධිකාරිය සමඟ එක්ව පිළියෙල කරනු ලබයි.

■ ග්‍රාමීය මට්ටමේ ආධුනිකත්ව පුහුණුව

කර්මාන්ත ශිල්පීය මට්ටමේ වෘත්තීන් සඳහා සකස් කරන ලද පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණුව ලබාදිය නොහැකි ආධුනිකයන් හට ග්‍රාමීය පුහුණු පහසුකම් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය මට්ටමේ සිටින පුහුණුලාභීන් හට පුහුණුව ලබාදීම ඉලක්ක කොට ග්‍රාමීය ආධුනිකත්ව පුහුණු ක්‍රමය හඳුන්වා දී ඇත. මේ සඳහා අවශ්‍ය කරන පුහුණු සම්මත එම ආයතනය සමඟ සාකච්ඡා කොට අධිකාරිය මඟින් පිළියෙල කරනු ලැබේ.

කර්මාන්ත පාදක කර්මාන්ත ශිල්පී ආධුනිකයන්ට සහ ජාතික වෘත්තීය සුදුසුකම සහතිකලාභීන්ට අදාළ න්‍යායික දැනුම පුහුණුව මඟින් සහ දුරස්ථ අධ්‍යාපනය මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

තවද ආධුනිකයන් හට අවශ්‍ය මූලික න්‍යායික හා ප්‍රායෝගික දැනුම යම් කාල පරිච්ඡේදයකදී අදාළ පුහුණු මධ්‍යස්ථානයක් මඟින් ලබා දෙන අතර තවදුරටත් ඔවුන්ට විෂය කරුණු ස්වයං අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දෙමින් මුද්‍රිත තැපැල් මාර්ගික පාඩම්මාලා මොඩියුලද අධිකාරිය මඟින් ලබා දෙනු ලැබේ. පාඩම්මාලා අවසානයේ ඇති ප්‍රශ්නාවලියට ආධුනිකයින් පිළිතුරු ලියා එවනු ලැබීමෙන් පසුව අදාළ නිවැරදි කිරීම් කොට නැවත ඔවුන් වෙත තැපැල් මඟින් යවනු ලැබේ.

මුද්‍රිත පාඩම්මාලා හැදෑරීමේදී පුහුණුවන්නන් මුහුණදෙන ගැටළු හා අපහසුතා නිරාකරණය කිරීමට කාලීනව සති අන්ත පන්ති අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබේ.

මීට අමතරව වෘත්තියට අදාළ ඉංග්‍රීසි දැනුම දියුණු කර ගැනීම සඳහා ඉංග්‍රීසි පාඩම්මාලා ද මෙම ආධුනිකයන් වෙත ලබා දෙනු ලැබේ.

■ ආයතනික පුහුණු/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව



මෙම ක්‍රමය යටතේ ආධුනිකයින් සෘජුවම ජාතික පුහුණු ආයතනයකට හෝ ප්‍රාදේශීය පුහුණු ආයතනයකට නියමිත කාලපරිච්ඡේදයකට අනුයුක්ත කර බඳවා ගනු ලබන අතර ඉන්පසුව පුද්ගලික හෝ රජයේ ආයතනයක කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. පුහුණු ආයතන හෝ පුහුණු මධ්‍යස්ථාන මඟින් අදාළ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

ලබාදෙනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධිකාරිය යටතේ ජාතික ආයතන තුනට (03) අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශවල පුහුණු මධ්‍යස්ථාන 74ක් පවත්වාගෙන යන ලදී. මේවායේ පවත්වන ලද පාඨමාලාවල කාලය මාස 06 සිට අවුරුදු 04 දක්වා වෙනස් වේ.

■ යන්ත්‍රාගාර පුහුණුව





1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 38 (සී) වගන්තියට අනුව මොරටුව, පේරාදෙණිය හා රුහුණු විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ගේ ඉංජිනේරු උපාධි සඳහා ද විශ්ව විද්‍යාල සහ අනෙකුත් තෘතීය අධ්‍යාපන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සඳහා ද අදාළ යන්ත්‍රාගාර පුහුණුව අධිකාරිය මඟින් ලබාදෙනු ලැබේ.

■ කාර්යස්ථ පුහුණුව

අනෙකුත් වෘත්තීය පුහුණු ආයතනවල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මඟින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතනවල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබූවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

කර්මාන්ත ශිල්පී ආධුනිකයින් සහ ජාතික ආධුනිකත්ව සහතික ක්‍රමය යටතේ පුහුණුව අවසන් කළ ආධුනිකයන් සඳහා අවසාන වෘත්තීය පරීක්ෂණය ප්‍රධාන කාර්යාලයේ ඇගයීම් අංශයෙන් පවත්වනු ලැබේ. එසේ වුවද පර්ෂද කාර්යාල පිහිටු වීමත් සමඟ මෙම කටයුතු විමධ්‍යගත කිරීමට අපේක්ෂා කරන බැවින් දැනට තුන් වන පර්ෂද යටතට ගැනෙන කොළඹ, ගම්පහ සහ රත්නපුර දිස්ත්‍රික්කවල පමණක් එම පර්ෂද කාර්යාල මඟින් අවසාන වෘත්තීය පරීක්ෂණය සිදුකරනු ලැබේ.

මීට අමතරව ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණය (NVQ) සහ ජාතික වෘත්තීය පරීක්ෂණ (NTT) සම්බන්ධ ඇගයීම් ද ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරයි.



ස්ථානානුරූපී සහ ග්‍රාමීය මට්ටමේ ආධුනිකයන් සඳහා වූ අවසාන වෘත්තීය පරීක්ෂණය අදාළ දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වනු ලැබේ.

ජාතික ආයතනයන්හි සියලුම සහතිකපත් අධ්‍යක්ෂ විදුහල්පති හෝ ලේඛකාධිකාරී සමඟ අධිකාරියේ සභාපතිතුමාගේ අත්සනින් යුතුව එම ආයතන මඟින් නිකුත් කරනු ලැබේ.

■ ජාතික වෘත්තීය පරීක්ෂණ හා ජාතික වෘත්තීය සුදුසුකම

මෙම වැඩසටහන මඟින් වෘත්තීය පරීක්ෂණ පවත්වා අදාළ නිපුණතා ඇති ශිල්පීන් හට ප්‍රවීණතා සහතික නිකුත් කිරීම සිදුකරයි. අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය වඩාත් භාවිත කරයි.

දැනට පවතින වෘත්තීය පරීක්ෂණ III ශ්‍රේණිය, II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය ලෙස අර්ධ නිපුණ, නිපුණ, විශිෂ්ට නිපුණ ලෙස මට්ටම් 3 කින් පැවැත්වේ. ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය ජාතික නිපුණතා සම්මත නොමැති වෘත්තීන් 10 කට සහ ශ්‍රී ලංකා පරිගණක නිපුණතා සහතිකය නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබෙයි.

ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය වර්තමානයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ක්‍රමය (NVQ) යටතේ පවතින පෙර ඉගෙනුම් පසු ඇගයීම (RPL) බවට පරිවර්තනය වෙමින් පවති. මේ සඳහා අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මඟපාදා දෙනු ලබයි.

මෙම වෘත්තීය ප්‍රවේශය සඳහා ආධුනිකයින්ගේ විශාල ඉල්ලුමක් පවතී. එමෙන්ම මෙහි වෘත්තීය මට්ටම VII දක්වා ශ්‍රේණි සකස්කොට ඇති හෙයින් පුහුණුලාභියාට තමා සම්පූර්ණ කළ මට්ටමේ සිට නැවත ඊළඟ මට්ටම ආරම්භ කළ හැකිවීම සුවිශේෂී තත්ත්වයකි. එමෙන්ම යම් මට්ටමකින් නවතන ලදුව නැවත ආරම්භ කරන්නේ නම් වෙනත් පුහුණු මධ්‍යස්ථානයක් ඔස්සේ එය සම්පූර්ණ කළ හැකිවීමද මෙහිදී පුහුණු වන්නාට ඇති සුවිශේෂී පහසුවකි. මෙහි ඇති සුවිශේෂීතාවය නම් පුහුණු වන්නාට උපාධි මට්ටම තෙක් අධ්‍යයන කටයුතු සිදු කිරීමට ඇති හැකියාව වේ.

■ ජාතික නිපුණතා සම්මත සංවර්ධන

අධිකාරිය මඟින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාළව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වේ. ජාතික නිපුණතා සම්මත පිළියෙල කිරීමේ නීතිමය බලය පනත මඟින්ම අධිකාරිය වෙත පැවරී ඇත.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගන්නා වෘත්තීන් සඳහා අදාළ ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සහ වලංගු ගතකිරීම මේ යටතේ සිදු කෙරේ.

ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුවක් මඟින් සකස් කරනු ලබන ජාතික නිපුණතා සම්මත එක් එක් වෘත්තීන්ට අදාළ සංවර්ධන කමිටුවක් මඟින් සංවර්ධනය කිරීම සහ පුනරීක්ෂණය කිරීම මෙහිදී සිදු කෙරේ.

ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුව එක් එක් ක්ෂේත්‍රයට සහ වෘත්තීන්ට විශේෂිත වූ පුද්ගලයින්ගෙන් සැලසුම්ලත් කමිටුවක් වන අතර මේ වන විට උපදේශක කමිටු 28ක් පමණ හඳුනාගෙන ඇත. මෙම එක් එක් කමිටුවකට සාමාජිකයන් 16 දෙනෙකු පමණ ඇතුළත් වේ.

■ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන

පුහුණුවේ යෙදී සිටින සහ පුහුණුව අවසන් කළ යන කොටස් දෙක සඳහාම මෙම වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහි ප්‍රධාන ඉලක්කය පුහුණුව අවසන් කළ පසු ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාව ලබා දීම වේ.

■ වෘත්තීය මාර්ගෝපදේශනය

පාසල් හැරගිය සහ පාසල් යන සිසුන්ගේ වෘත්තීය පුහුණුව පිළිබඳව සහ විශේෂයෙන් රැකියා වෙළඳපොල පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

■ කාර්ය මණ්ඩල සංවර්ධනය සහ පෞරුෂත්ව සංවර්ධනය

නයිටා ආයතනයේ සේවකයින්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන් විවිධ අදියර යටතේ සිදුකරනු ලබන අතර ඔවුන්ගේ රැකියා වැඩකටයුතු වලට සිදුවන බාධාවන් අවම වන පරිදි පවත්වාගෙන යනු ලැබේ.

දත්ත නිරූපණය

වගුව 01 - මධ්‍යස්ථාන, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව හා ජාතික ආයතනවල ආධුනිකයින් බඳවාගැනීමේ ප්‍රගතිය නිරූපණය

2021		ඉලක්ක	බඳවාගැනීම්	බඳවාගැනීම් ප්‍රතිශතය
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව				
ජාතික වෘත්තීය සුදුසුකම		18,500	7,115	**38.5%**
කර්මාන්ත ශිල්පී		3,000	2,419	**80.6%**
ස්ථානානුරූපී		2,750	823	**29.9%**
ග්‍රාමීය මට්ටම		1,500	359	**23.9%**
විශේෂ පුහුණුව (ASTA, බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		3,000	3,263	**108.8%**
13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන		1,000	480	**48.0%**
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව				
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම	3,380	2,282	**67.5%**
	ජාතික වෘත්තීය සුදුසුකම නොවන	520	233	**44.8%**
අර්ධ කාලීන		2,000	93	**4.7%**
ජාතික ආයතන				
පූර්ණ කාලීන		1,390	390	**28.1%**
අර්ධ කාලීන		1,000	300	**30.0%**
වෙනත්				
විශේෂ කර්මාන්ත පුහුණුව		15,000	5,439	**36.3%**
රැකියාස්ථ පුහුණුව		15,500	6,286	**40.6%**
13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන (රැකියාස්ථ පුහුණුව)		1,200	404	**33.7%**
බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය		65,508	34,738	**53.0%**
එකතුව		**135,248**	**64,624**	**47.8%**

2021 වසරේදී ආධුනිකයින් අදාළ පුහුණු පාඨමාලා සඳහා අනුයුක්ත කර ගැනීමේදී ආයතනය විසින් අපේක්ෂිත වූ ඉලක්ක ගත සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය මෙම වගුව මඟින් නිරූපණය වේ. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද 47.8%ක බඳවාගැනීම් ඉලක්ක සපුරා ගැනීමේ හැකියාවක් අප ආයතනය සතු විය. එහිදී කර්මාන්තගත ආධුනිකත්ව පුහුණුව යටතේ ඇති විශේෂ පුහුණු වැඩසටහන යටතේ අපේක්ෂිත සිසුන් බඳවා ගැනීමටත් වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීමට හැකි වූ අතර මධ්‍යස්ථාන පාදක පුහුණුව යටතේ වූ ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාව යටතේ ඉලක්ක සපුරා ගැනීමේ වර්ධනයක් පෙන්නුම් කරයි.

ප්‍රස්ථාරය 01 - පුහුණු කිරීමේ කාර්යන්හි සාරාංශය (වසර 07ක් තුළ)



ආධුනික බඳවා ගැනීම, ආධුනිකයින් පුහුණුව හැරයාම, ආධුනිකයින් පුහුණුව සම්පූර්ණ කිරීම හා පුහුණුවේ රැඳී සිටීම පෙර වසර 07 සමඟ සැසඳීම මෙමඟින් නිරූපණය කරයි. ආධුනිකයින් බඳවා ගැනීමේ ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. 2019 වසරේ ඉහළම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගෙන ඇති නමුත් කොවිඩ් වසංගතය හමුවේ එහි ප්‍රබල අඩුවීමක් 2020 හා 2021 වසරේ පෙන්නුම් කරයි. කෙසේ නමුදු එය 2020 වසරට සාපේක්ෂව ඉහළ අගයක් කරා ළඟා වී ඇත. පුහුණුව හැරයාම පෙර වසර හා සැසඳීමේ දී අවපාතනයක් පෙන්නුම් කරමින් සාධනීය මට්ටමින් ළඟා කර ගැනීමට හැකි වී ඇත. පාඨමාලා සම්පූර්ණ කිරීම පෙර වර්ෂ 02ක තුළ අඩු වීමක් පෙන්නුම් කරයි. සමස්තයක් වශයෙන් ගත් කළ පෙර වසර කිහිපයට සාපේක්ෂව 2020 - 2021 වසර පරාසය තුළ සියලු පුහුණු කිරීමේ කාර්යයන්හි අවපාතනයක් නිරූපණය කිරීමට ප්‍රධාන හේතුව වශයෙන් කොවිඩ් වසංගත තත්ත්වය ප්‍රබල ලෙස බලපා ඇත.

වගුව 02 - පුහුණු කිරීම් කාර්යයන්හි ප්‍රගතිය පෙර වර්ෂය හා සැසඳීම

2021		බඳවාගැනීම්		පුහුණුව හැරයාම්		පුහුණුව සම්පූර්ණ කිරීම්		පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව	
		2020	2021	2020	2021	2020	2021	2020	2021
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව									
ජාතික වෘත්තීය සුදුසුකම		4,682	7,115	2,216	1,221	6,377	4,541	6,790	8,143
කර්මාන්ත ශිල්පී		1,386	2,419	1,083	645	2,532	1,879	3,434	3,329
ස්ථානානුරූපී		812	823	603	95	731	353	278	653
ග්‍රාමීය මට්ටම		402	359	281	81	323	186	160	252
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		3,525	3,263	571	222	1,679	4,045	1,413	409
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව									
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම නොවන	593	233	523	37	451	177	211	230
	ජාතික වෘත්තීය සුදුසුකම	921	2,282	413	222	2,306	1,137	1,297	2,220
අර්ධ කාලීන		216	93	95	-	321	70	19	42
ජාතික ආයතන									
පූර්ණ කාලීන		1,327	390	395	352	686	925	3,056	2,169
අර්ධ කාලීන		343	300	86	101	224	300	113	12
එකතුව		**14,207**	**17,277**	**6,266**	**2,976**	**15,630**	**13,613**	**16,771**	**17,459**
වෙනත්									
විශේෂ කර්මාන්ත පුහුණුව		3,962	5,439	-	-	8,284	4,696	3,500	4,243
රැකියාස්ථ පුහුණුව		8,064	6,690	897	1,945	8,167	5,581	1,408	572
එකතුව		**26,233**	**29,406**	**7,163**	**4,921**	**32,081**	**23,890**	**21,679**	**22,274**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

2021 වසර සැලකීමේ දී 29,406 ආධුනිකයින් බඳවා ගනිමින් 2020 වර්ෂයට වඩා 12% කට ආසන්න වූ වර්ධනයක් පෙන්නුම් කරයි. කර්මාන්තගත ආධුනිකත්ව පුහුණුව යටතේ සිසුන් ඇතුළත් වීමේ ඉහළ ප්‍රවණතාවයක් නිරූපණය වන අතර එහිදී ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත වූ ආධුනිකයින් සංඛ්‍යාව ඉහළ අගයක් ගනී. මධ්‍යස්ථානගත පුහුණුව හා ජාතික ආයතන වලට බඳවා ගැනීමේදී සුවිශේෂී ප්‍රගතියක් පෙන්නුම් කරයි. පුහුණුව හැරයාම පෙර වසර හා සැසඳීමේදී විශාල අඩුවීමක් පෙන්නුම් කරමින් සාධනීය ප්‍රගතියක් පාඨමාලා හැදෑරීම් යටතේ දක්නට ලැබේ. එය ප්‍රතිශතයක් වශයෙන් වශයෙන් ගත් කළ 31%ක් පමණ වූ අඩුවීමකි. පාඨමාලා සාර්ථකව අවසන් කිරීම පෙර වසර හා සැසඳීමේදී අඩුවීමක් පෙන්නුම් කළත් කර්මාන්තගත ආධුනික පුහුණුව යටතේ වූ විශේෂ පුහුණුව යටතේ පාඨමාලා සම්පූර්ණ කිරීම පෙර වසර හා සැසඳීමේදී සාධනීය ප්‍රගතියක් පෙන්වයි. 22,274 ක ආධුනික සංඛ්‍යාවක් 2021 වසර වන විට තවදුරටත් පුහුණුවෙහි රැඳී සිටියි.

වගුව 03 - සමාලෝචිත වර්ෂය තුළ පුහුණු කිරීම් කාර්යයන්හි සාරාංශය

2021	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව												
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	4,336	2,779	7,115	806	415	1,221	2,895	1,646	4,541	5,268	2,875	8,143
කර්මාන්ත ශිල්පී	1,206	1,213	2,419	532	113	645	1,235	644	1,879	1,995	1,334	3,329
ස්ථානානුරූපී	443	380	823	77	18	95	166	187	353	366	287	653
ග්‍රාමීය මට්ටම	58	301	359	4	77	81	24	162	186	52	200	252
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර/ආබාධිත)	3,175	88	3,263	221	1	222	3,959	86	4,045	407	2	409
එකතුව	**9,218**	**4,761**	**13,979**	**1,640**	**624**	**2,264**	**8,279**	**2,725**	**11,004**	**8,088**	**4,698**	**12,786**
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව												
ජාතික වෘත්තීය සුදුසුකම නොවන (Non NVQ)	5	228	233	-	37	37	10	167	177	5	225	230
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	636	1,646	2,282	94	128	222	341	796	1,137	655	1,565	2,220
අර්ධ කාලීන	18	75	93	-	-	-	21	49	70	6	36	42
එකතුව	**659**	**1,949**	**2,608**	**94**	**165**	**259**	**372**	**1,012**	**1,384**	**666**	**1,826**	**2,492**
ජාතික ආයතන												
පූර්ණ කාලීන	320	70	390	320	32	352	765	160	925	1,855	314	2,169
අර්ධ කාලීන	293	7	300	101	-	101	293	7	300	12	-	12
එකතුව	**613**	**77**	**690**	**421**	**32**	**453**	**1,058**	**167**	**1,225**	**1,867**	**314**	**2,181**
වෙනත්												
විශේෂ කර්මාන්ත පුහුණුව	2,800	2,639	5,439	-	-	-	2,766	1,930	4,696	2,228	2,015	4,243
රැකියාස්ථ පුහුණුව	3,643	3,047	6,690	1,072	873	1,945	3,013	2,568	5,581	334	238	572
එකතුව	**6,443**	**5,686**	**12,129**	**1,072**	**873**	**1,945**	**5,779**	**4,498**	**10,277**	**2,562**	**2,253**	**4,815**
මුළු එකතුව	**16,933**	**12,473**	**29,406**	**3,227**	**1,694**	**4,921**	**15,488**	**8,402**	**23,890**	**13,183**	**9,091**	**22,274**

කර්මාන්තගත පුහුණුව, මධ්‍යස්ථානගත පුහුණුව, ජාතික ආයතන හා අනෙකුත් පුහුණු කිරීම් යටතේ පුහුණු කිරීම් කාර්යයන්හි ප්‍රගතිය මෙමඟින් නිරූපණය වේ. එහිදී 29,406ක් වූ ආධුනික බඳවා ගැනීම තුළ ප්‍රතිශතයක් ලෙස 48%ක් පමණ වූ ආධුනික ප්‍රමාණයක් කර්මාන්තගත පුහුණුව යටතේද 8%ක ප්‍රතිශතයක් මධ්‍යස්ථානගත පුහුණුව යටතේද 41%ක ප්‍රතිශතයක් අනෙකුත් පුහුණු කිරීම් යටතේද, 2%ක ප්‍රතිශතයක් ජාතික ආයතන යටතේද අප ආයතනය හා පුහුණුව ලැබීමට එක්වී ඇත.

ප්‍රස්ථාරය 02 - සමාලෝචිත වර්ෂය තුළ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණුව සඳහා බඳවාගැනීම්



මෙම වසරේ 58%ක් වූ පිරිමි ආධුනිකයින් සංඛ්‍යාවක් පාඨමාලා හැදෑරීම සඳහා අප ආයතනය සමඟ සම්බන්ධ වී ඇති අතර කාන්තා ආධුනිකයින් බඳවා ගැනීම ගත් කළ ප්‍රතිශතාත්මකව එය 42%ක අගයක් ගනී.

වගුව 04 - පුහුණු කිරීම් කාර්යයන්හි සාරාංශය (දිස්ත්‍රික් මට්ටමින්)

දිස්ත්‍රික්කය	ඉලක්ක	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	3,385	375	151	526	14	-	14	624	242	866	846	324	1,170
ගම්පහ	2,545	608	108	716	311	46	357	458	120	578	540	126	666
කළුතර	1,790	354	215	569	83	17	100	169	95	264	394	184	578
මහනුවර	2,150	219	184	403	17	34	51	176	177	353	333	185	518
මාතලේ	850	119	117	236	29	12	41	48	70	118	129	121	250
නුවරඑළිය	995	66	268	334	10	20	30	79	163	242	73	264	337
ගාල්ල	2,435	522	548	1,070	179	60	239	302	238	540	549	551	1,100
මාතර	2,040	531	411	942	89	51	140	309	274	583	474	405	879
හම්බන්තොට	1,092	316	349	665	38	49	87	225	205	430	240	317	557
යාපනය	1,040	450	339	789	50	37	87	631	160	791	303	346	649
මන්නාරම	540	382	142	524	5	-	5	375	112	487	240	144	384
වවුනියා	1,045	532	311	843	38	10	48	520	171	691	223	216	439
මුලතිව්	580	292	237	529	14	49	63	422	155	577	124	212	336
කිළිනොච්චි	925	410	189	599	76	24	100	493	114	607	214	155	369
මඩකළපුව	1,000	966	449	1,415	110	29	139	832	193	1,025	622	381	1,003
අම්පාර	1,013	769	176	945	98	3	101	698	138	836	584	211	795
ත්‍රිකුණාමලය	855	837	608	1,445	155	41	196	977	166	1,143	653	632	1,285
කුරුණෑගල	2,370	233	347	580	44	9	53	216	158	374	340	341	681

දිස්ත්‍රික්කය	ඉලක්ක	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
පුත්තලම	1,346	304	183	487	72	66	138	222	86	308	284	153	437
අනුරාධපුර	1,360	372	175	547	69	63	132	157	117	274	311	162	473
පොළොන්නරුව	838	335	194	529	26	16	42	185	80	265	316	175	491
බදුල්ල	1,235	156	288	444	48	33	81	61	132	193	154	233	387
මොණරාගල	805	121	107	228	28	20	48	66	94	160	116	111	227
රත්නපුර	1,443	351	250	601	51	38	89	260	143	403	445	264	709
කෑගල්ල	973	257	364	621	80	62	142	146	134	280	247	311	558
එකතුව	**34,650**	**9,877**	**6,710**	**16,587**	**1,734**	**789**	**2,523**	**8,651**	**3,737**	**12,388**	**8,754**	**6,524**	**15,278**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්තගත සහ මධ්‍යස්ථානගත පුහුණුවීම් වල පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශගතය මෙමඟින් දැක්වේ. එහිදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඉලක්කගත ආධුනික සංඛ්‍යාවට වඩා ආධුනිකයින් බඳවා ගැනීමට මෙම වසරේ හැකි විය. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද 16,587ක් වූ ආධුනිකයින් බඳවා ගනිමින් ඉලක්කගත බඳවා ගැනීමෙහිලා සාර්ථකත්වය කරා ළඟා වීමට අප ආයතනයට හැකි විය. දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණුව සාර්ථකව නිම කළ සංඛ්‍යාව 12,388ක් වන අතර 15,278ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් තවදුරටත් පුහුණුවේ රැඳී සිටියි.

ප්‍රස්ථාරය 03 - ජාතික ආධුනිකත්ව පුහුණුව (අර්ධකාලීන ආධුනිකත්ව පුහුණුව හැර)



සමාලෝචිත වර්ෂය තුළදී ජාතික වෘත්තීය සුදුසුකම සහ අනෙකුත් පුහුණු කිරීම් යටතේ ආධුනිකයින් බඳවා ගැනීම ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ. ජාතික වෘත්තීය සුදුසුකම යටතේදී වැඩිම ආධුනික සංඛ්‍යාවක් අප ආයතනය හා සම්බන්ධ වී ඇත. එහිදී වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් කර්මාන්තගත පුහුණුව යටතේ පාඨමාලා හදාරයි. ජාතික ආයතන හරහාද ජාතික වෘත්තීය සුදුසුකම හා ජාතික වෘත්තීය සුදුසුකම නොවන පාඨමාලාද පිරිනමනු ලබයි. කර්මාන්ත ශිල්පී, ස්ථානානුරූපී, ග්‍රාමීය මට්ටම හා ජාතික වෘත්තීය පරීක්ෂණ ලෙස ජාතික වෘත්තීය සුදුසුකම නොවන පාඨමාලා ලෙස වර්ගීකරණය කළ හැක.

වගුව 05 - මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව පූර්ණ කාලීන දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	38	49	87	-	-	-	19	30	49	38	49	87
ගම්පහ	12	29	41	-	2	2	2	25	27	12	29	41
කළුතර	41	53	94	-	-	-	17	18	35	60	53	113
මහනුවර	29	32	61	10	16	26	38	54	92	60	38	98
මාතලේ	10	64	74	2	2	4	10	28	38	10	63	73
නුවරඑළිය	9	192	201	3	9	12	2	96	98	9	191	200
ගාල්ල	40	114	154	3	2	5	57	59	116	37	112	149
මාතර	4	113	117	-	7	7	3	53	56	4	121	125
හම්බන්තොට	24	117	141	5	15	20	7	80	87	32	90	122
යාපනය	28	80	108	3	9	12	4	32	36	27	72	99
මන්නාරම	-	41	41	-	-	-	1	49	50	-	41	41
වවුනියා	10	33	43	1	4	5	5	12	17	10	30	40
කිළිනොච්චි	83	118	201	28	17	45	32	44	76	63	105	168
මඩකළපුව	48	32	80	-	-	-	-	-	-	61	32	93
අම්පාර	-	-	-	-	-	-	-	-	-	-	10	10
ත්‍රිකුණාමලය	54	87	141	12	5	17	26	32	58	43	84	127
කුරුණෑගල	29	102	131	4	4	8	85	77	162	25	98	123
පුත්තලම	26	103	129	5	20	25	10	35	45	23	91	114
අනුරාධපුර	23	64	87	11	25	36	8	47	55	14	48	62
පොළොන්නරුව	51	52	103	2	6	8	5	19	24	50	46	96
බදුල්ල	28	115	143	-	9	9	7	55	62	28	106	134
මොණරාගල	12	30	42	-	4	4	2	18	20	12	30	42
රත්නපුර	15	93	108	4	6	10	3	28	31	15	93	108
කෑගල්ල	27	161	188	1	3	4	8	72	80	27	158	185
එකතුව	**641**	**1,874**	**2,515**	**94**	**165**	**259**	**351**	**963**	**1,314**	**660**	**1,790**	**2,450**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුවේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීමේ සාරාංශය මෙම වගුව මඟින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක මට්ටමින් 2,515ක් වූ ආධුනික සංඛ්‍යාවක් බඳවාගෙන ඇති අතර තවදුරටත් පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව 2,450කි. වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවාගෙන ඇත්තේ නුවරඑළිය හා කිළිනොච්චි දිස්ත්‍රික්කයෙනි. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 7%ක ප්‍රමාණයකි.

අම්පාර හා මුලතිව් දිස්ත්‍රික්ක තුළ මෙම වසරේදී මධ්‍යස්ථාන පාදක පුහුණුව යටතේ කිසිදු ආධුනික බඳවා ගැනීමක් සිදු වී නොමැත. වැඩිම ආධුනික සංඛ්‍යාවක් තවදුරටත් පුහුණුවේ රැඳී සිටින්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි.

වගුව 06 - කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව (දිස්ත්‍රික්ක මට්ටමින්)

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	337	102	439	14	-	14	605	212	817	808	275	1,083
ගම්පහ	596	79	675	311	44	355	456	95	551	528	97	625
කළුතර	305	136	441	83	17	100	144	51	195	334	131	465
මහනුවර	190	152	342	7	18	25	138	123	261	273	147	420
මාතලේ	109	53	162	27	10	37	38	42	80	119	58	177
නුවරඑළිය	57	76	133	7	11	18	77	67	144	64	73	137
ගාල්ල	482	434	916	176	58	234	245	179	424	512	439	951
මාතර	527	298	825	89	44	133	297	211	508	470	284	754
හම්බන්තොට	292	232	524	33	34	67	218	125	343	208	227	435
යාපනය	422	259	681	47	28	75	627	128	755	276	274	550
මන්නාරම	382	101	483	5	-	5	374	63	437	240	103	343
වවුනියා	522	278	800	37	6	43	515	159	674	213	186	399
මුලතිව්	292	237	529	14	49	63	422	155	577	124	212	336
කිළිනොච්චි	327	71	398	48	7	55	461	70	531	151	50	201
මඩකලපුව	918	417	1,335	110	29	139	832	193	1,025	561	349	910
අම්පාර	769	176	945	98	3	101	698	138	836	584	201	785
ත්‍රිකුණාමලය	783	521	1,304	143	36	179	951	134	1,085	610	548	1,158
කුරුණෑගල	204	245	449	40	5	45	131	81	212	315	243	558
පුත්තලම	278	80	358	67	46	113	212	51	263	261	62	323
අනුරාධපුර	349	111	460	58	38	96	149	70	219	297	114	411
පොළොන්නරුව	284	142	426	24	10	34	180	61	241	266	129	395
බදුල්ල	124	160	284	48	24	72	50	64	114	126	127	253
මොණරාගල	109	77	186	28	16	44	64	76	140	104	81	185
රත්නපුර	336	157	493	47	32	79	257	115	372	430	171	601
කෑගල්ල	224	167	391	79	59	138	138	62	200	214	117	331
එකතුව	**9,218**	**4,761**	**13,979**	**1,640**	**624**	**2,264**	**8,279**	**2,725**	**11,004**	**8,088**	**4,698**	**12,786**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව සිදු කරනු ලබන එකම ආයතනය වන අප ආයතනය ඉලක්ක ජයගනිමින් සමාලෝචිත වර්ෂය තුළ ආධුනිකයින් 13,979ක් දිස්ත්‍රික්ක මට්ටමින් බඳවාගෙන ඇති අතර ආධුනිකයින් 11,004ක් සමාලෝචිත වර්ෂය තුළදී පුහුණුව සාර්ථකව අවසන් කර ඇත. තවදුරටත් පුහුණුවේ රැඳී සිටින ආධුනිකයින් සංඛ්‍යාව 12,786කි. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවාගෙන ඇත්තේ මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වන අතර මන්නාරම දිස්ත්‍රික්කය තුළ පුහුණුව හැරයාම අවම අගයක් ගනී. තවදුරටත් කර්මාන්තගත පුහුණුවේ යෙදී සිටින ආධුනිකයින්ගෙන් වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ පාඨමාලාවේ නිරතවෙයි.

වෘත්තීය ක්ෂේත්‍රයට සම්බන්ධවීමට අවශ්‍ය මූලික දැනුම ලබාදීම මේ තුළින් අපේක්ෂා කරන අතර රැකියා ක්ෂේත්‍රයේ සුවිශේෂී හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ පුහුණුලාභියෙකු වශයෙන් ආධුනිකයින් බිහි කිරීම කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව යටතේදී සිදු කරයි.

වගුව 07 - කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව (පුහුණු කිරීම් මට්ටම)

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	ජාතික වෘත්තීය සුදුසුකම	192	102	294	-	-	-	321	145	466	430	201	631
	කර්මාන්ත ශිල්පී	92	-	92	14	-	14	227	67	294	378	74	452
	ස්ථානානුරූපී	-	-	-	-	-	-	-	-	-	-	-	-
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	53	-	53	-	-	-	57	-	57	-	-	-
ගම්පහ	ජාතික වෘත්තීය සුදුසුකම	258	63	321	122	41	163	128	57	185	312	81	393
	කර්මාන්ත ශිල්පී	66	12	78	90	3	93	89	20	109	208	13	221
	ස්ථානානුරූපී	4	3	7	7	-	7	17	17	34	2	3	5
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	268	1	269	92	-	92	222	1	223	6	-	6
කළුතර	ජාතික වෘත්තීය සුදුසුකම	149	93	242	36	14	50	53	38	91	160	89	249
	කර්මාන්ත ශිල්පී	63	20	83	31	1	32	31	9	40	95	22	117
	ස්ථානානුරූපී	51	23	74	4	2	6	-	4	4	48	20	68
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	42	-	42	12	-	12	60	-	60	31	-	31

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
මහනුවර	ජාතික වෘත්තීය සුදුසුකම	112	146	258	7	18	25	136	110	246	192	141	333
	කර්මාන්ත ශිල්පී	2	-	2	-	-	-	1	6	7	5	1	6
	ස්ථානානුරූපී	2	6	8	-	-	-	1	7	8	2	5	7
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	74	-	74	-	-	-	-	-	-	74	-	74
මාතලේ	ජාතික වෘත්තීය සුදුසුකම	87	47	134	21	10	31	34	38	72	95	51	146
	කර්මාන්ත ශිල්පී	4	4	8	6	-	6	4	1	5	6	5	11
	ස්ථානානුරූපී	-	2	2	-	-	-	-	3	3	-	2	2
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	18	-	18	-	-	-	-	-	-	18	-	18
නුවරඑළිය	ජාතික වෘත්තීය සුදුසුකම	50	30	80	6	7	13	65	51	116	57	27	84
	කර්මාන්ත ශිල්පී	4	30	34	1	4	5	12	16	28	4	30	34
	ස්ථානානුරූපී	3	16	19	-	-	-	-	-	-	3	16	19
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	-	-	-	-	-	-	-	-	-	-	-	-

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ගාල්ල	ජාතික වෘත්තීය සුදුසුකම	302	315	617	147	37	184	169	138	307	373	307	680
	කර්මාන්ත ශිල්පී	56	78	134	24	13	37	20	23	43	66	93	159
	ස්ථානානුරූපී	14	41	55	5	6	11	7	13	20	12	39	51
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	2	2	-	5	5	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	110	-	110	-	-	-	49	-	49	61	-	61
මාතර	ජාතික වෘත්තීය සුදුසුකම	262	160	422	48	24	72	108	143	251	320	167	487
	කර්මාන්ත ශිල්පී	65	135	200	41	16	57	51	66	117	88	116	204
	ස්ථානානුරූපී	-	1	1	-	2	2	-	-	-	-	-	-
	ග්‍රාමීය මට්ටම	-	2	2	-	2	2	-	2	2	-	1	1
	විශේෂ පුහුණු වැඩසටහන	200	-	200	-	-	-	138	-	138	62	-	62
හම්බන්තොට	ජාතික වෘත්තීය සුදුසුකම	224	200	424	16	25	41	176	114	290	159	196	355
	කර්මාන්ත ශිල්පී	1	4	5	14	9	23	9	3	12	2	4	6
	ස්ථානානුරූපී	30	26	56	-	-	-	-	1	1	30	25	55
	ග්‍රාමීය මට්ටම	-	2	2	-	-	-	-	7	7	-	2	2
	විශේෂ පුහුණු වැඩසටහන	37	-	37	3	-	3	33	-	33	17	-	17

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
යාපනය	ජාතික වෘත්තීය සුදුසුකම	100	131	231	7	20	27	20	61	81	100	121	221
	කර්මාන්ත ශිල්පී	148	75	223	38	8	46	95	57	152	168	110	278
	ස්ථානානුරූපී	6	32	38	2	-	2	-	10	10	4	22	26
	ග්‍රාමීය මට්ටම	4	21	25	-	-	-	-	-	-	4	21	25
	විශේෂ පුහුණු වැඩසටහන	164	-	164	-	-	-	512	-	512	-	-	-
මන්නාරම	ජාතික වෘත්තීය සුදුසුකම	104	47	151	-	-	-	127	18	145	75	46	121
	කර්මාන්ත ශිල්පී	41	9	50	5	-	5	70	21	91	104	36	140
	ස්ථානානුරූපී	61	21	82	-	-	-	-	-	-	61	21	82
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	176	24	200	-	-	-	177	24	201	-	-	-
වවුනියා	ජාතික වෘත්තීය සුදුසුකම	136	118	254	11	5	16	57	28	85	128	106	234
	කර්මාන්ත ශිල්පී	67	62	129	20	-	20	35	41	76	70	42	112
	ස්ථානානුරූපී	42	20	62	5	1	6	42	14	56	14	13	27
	ග්‍රාමීය මට්ටම	4	64	68	1	-	1	4	62	66	1	25	26
	විශේෂ පුහුණු වැඩසටහන	273	14	287	-	-	-	377	14	391	-	-	-

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
මුලතිව්	ජාතික වෘත්තීය සුදුසුකම	66	23	89	-	-	-	212	43	255	84	44	128
	කර්මාන්ත ශිල්පී	32	105	137	14	-	14	18	45	63	38	119	157
	ස්ථානානුරූපී	4	94	98	-	-	-	2	52	54	2	49	51
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	49	49	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	190	15	205	-	-	-	190	15	205	-	-	-
කිළිනොච්චි	ජාතික වෘත්තීය සුදුසුකම	117	64	181	-	7	7	-	43	43	121	50	171
	කර්මාන්ත ශිල්පී	15	-	15	12	-	12	34	20	54	29	-	29
	ස්ථානානුරූපී	5	-	5	1	-	1	3	-	3	1	-	1
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	190	7	197	35	-	35	424	7	431	-	-	-
මඩකළපුව	ජාතික වෘත්තීය සුදුසුකම	197	68	265	-	1	1	131	9	140	167	67	234
	කර්මාන්ත ශිල්පී	242	232	474	100	26	126	220	109	329	301	221	522
	ස්ථානානුරූපී	105	24	129	9	2	11	21	10	31	91	22	113
	ග්‍රාමීය මට්ටම	2	73	75	-	-	-	-	44	44	2	39	41
	විශේෂ පුහුණු වැඩසටහන	372	20	392	1	-	1	460	21	481	-	-	-

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
අම්පාර	ජාතික වෘත්තීය සුදුසුකම	186	44	230	11	1	12	179	20	199	209	49	258
	කර්මාන්ත ශිල්පී	170	112	282	36	2	38	178	84	262	283	135	418
	ස්ථානානුරූපී	67	18	85	2	-	2	59	33	92	57	16	73
	ග්‍රාමීය මට්ටම	38	1	39	3	-	3	20	-	20	35	1	36
	විශේෂ පුහුණු වැඩසටහන	308	1	309	46	-	46	262	1	263	-	-	-
ත්‍රිකුණාමලය	ජාතික වෘත්තීය සුදුසුකම	408	250	658	58	34	92	248	123	371	474	277	751
	කර්මාන්ත ශිල්පී	113	226	339	78	2	80	118	10	128	125	227	352
	ස්ථානානුරූපී	11	-	11	6	-	6	7	-	7	2	-	2
	ග්‍රාමීය මට්ටම	9	44	53	-	-	-	-	-	-	9	44	53
	විශේෂ පුහුණු වැඩසටහන	242	1	243	1	-	1	578	1	579	-	-	-
කුරුණෑගල	ජාතික වෘත්තීය සුදුසුකම	200	202	402	40	3	43	123	64	187	311	199	510
	කර්මාන්ත ශිල්පී	4	43	47	-	2	2	7	17	24	4	43	47
	ස්ථානානුරූපී	-	-	-	-	-	-	1	-	1	-	1	1
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	-	-	-	-	-	-	-	-	-	-	-	-

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
පුත්තලම	ජාතික වෘත්තීය සුදුසුකම	118	57	175	67	32	99	91	27	118	166	57	223
	කර්මාන්ත ශිල්පී	2	3	5	-	1	1	1	-	1	2	3	5
	ස්ථානානුරූපී	-	-	-	-	-	-	-	-	-	-	-	-
	ග්‍රාමීය මට්ටම	-	16	16	-	13	13	-	22	22	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	158	4	162	-	-	-	120	2	122	93	2	95
අනුරාධපුර	ජාතික වෘත්තීය සුදුසුකම	246	110	356	26	37	63	75	70	145	297	114	411
	කර්මාන්ත ශිල්පී	-	-	-	1	-	1	2	-	2	-	-	-
	ස්ථානානුරූපී	-	-	-	-	-	-	-	-	-	-	-	-
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	103	1	104	31	1	32	72	-	72	-	-	-
පොළොන්නරුව	ජාතික වෘත්තීය සුදුසුකම	235	138	373	19	10	29	172	52	224	216	126	342
	කර්මාන්ත ශිල්පී	4	4	8	-	-	-	3	9	12	5	3	8
	ස්ථානානුරූපී	-	-	-	5	-	5	5	-	5	-	-	-
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	45	-	45	-	-	-	-	-	-	45	-	45

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
බදුල්ල	ජාතික වෘත්තීය සුදුසුකම	123	62	185	47	9	56	49	25	74	125	58	183
	කර්මාන්ත ශිල්පී	-	-	-	1	3	4	1	-	1	-	1	1
	ස්ථානානුරූපී	-	20	20	-	1	1	-	19	19	-	1	1
	ග්‍රාමීය මට්ටම	1	78	79	-	11	11	-	20	20	1	67	68
	විශේෂ පුහුණු වැඩසටහන	-	-	-	-	-	-	-	-	-	-	-	-
මොණරාගල	ජාතික වෘත්තීය සුදුසුකම	85	50	135	26	15	41	42	76	118	93	53	146
	කර්මාන්ත ශිල්පී	3	7	10	2	1	3	7	-	7	5	8	13
	ස්ථානානුරූපී	6	20	26	-	-	-	-	-	-	6	20	26
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	15	-	15	-	-	-	15	-	15	-	-	-
රත්නපුර	ජාතික වෘත්තීය සුදුසුකම	263	135	398	45	24	69	127	100	227	408	152	560
	කර්මාන්ත ශිල්පී	6	12	18	-	6	6	2	13	15	6	9	15
	ස්ථානානුරූපී	16	10	26	2	2	4	1	2	3	16	10	26
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	51	-	51	-	-	-	127	-	127	-	-	-

දිස්ත්‍රික්කය	පුහුණු ක්‍රමය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කෑගල්ල	ජාතික වෘත්තීය සුදුසුකම	116	124	240	46	41	87	52	53	105	196	96	292
	කර්මාන්ත ශිල්පී	6	40	46	4	16	20	-	7	7	3	19	22
	ස්ථානානුරූපී	16	3	19	29	2	31	-	2	2	15	2	17
	ග්‍රාමීය මට්ටම	-	-	-	-	-	-	-	-	-	-	-	-
	විශේෂ පුහුණු වැඩසටහන	86	-	86	-	-	-	86	-	86	-	-	-
එකතුව	ජාතික වෘත්තීය සුදුසුකම	**4,336**	**2,779**	**7,115**	**806**	**415**	**1,221**	**2,895**	**1,646**	**4,541**	**5,268**	**2,875**	**8,143**
	කර්මාන්ත ශිල්පී	**1,206**	**1,213**	**2,419**	**532**	**113**	**645**	**1,235**	**644**	**1,879**	**1,995**	**1,334**	**3,329**
	ස්ථානානුරූපී	**443**	**380**	**823**	**77**	**18**	**95**	**166**	**187**	**353**	**366**	**287**	**653**
	ග්‍රාමීය මට්ටම	**58**	**301**	**359**	**4**	**77**	**81**	**24**	**162**	**186**	**52**	**200**	**252**
	විශේෂ පුහුණු වැඩසටහන	**3,175**	**88**	**3,263**	**221**	**1**	**222**	**3,959**	**86**	**4,045**	**407**	**2**	**409**
මුළු එකතුව		**9,218**	**4,761**	**13,979**	**1,640**	**624**	**2,264**	**8,279**	**2,725**	**11,004**	**8,088**	**4,698**	**12,786**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

වගුව මගින් සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් ජාතික වෘත්තීය සුදුසුකම, කර්මාන්ත ශිල්පී, ස්ථානානුරූපී හා ග්‍රාමීය මට්ටමේ පුහුණුව යන පුහුණු වෘත්තීන්ගේ කාර්යය සාධනය පෙන්නුම් කරයි. එහිදී දිස්ත්‍රික්ක 25 තුළින් පුහුණුව හැදෑරීම සඳහා සම්බන්ධ වී ඇති ආධුනිකයින් 13,979ක් අතුරින් 51%කට ආසන්න ප්‍රතිශතයක් ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා පුහුණුව හැදෑරීම සඳහා යොමුව ඇත. එසේම කර්මාන්ත ශිල්පී හා විශේෂ පුහුණුව යටතේදී පාඨමාලා හැදෑරීම සඳහා ඉහළ ඉල්ලීමක් ඇති බවද මෙමගින් නිරූපණය වේ.

වගුව 08 - අර්ධකාලීන පුහුණු කිරීම් සාරාංශය

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කළුතර	8	26	34	-	-	-	8	26	34	-	-	-
මාතර	-	-	-	-	-	-	9	10	19	-	-	-
බදුල්ල	4	13	17	-	-	-	4	13	17	-	-	-
කෑගල්ල	6	36	42	-	-	-	-	-	-	6	36	42
එකතුව	**18**	**75**	**93**	**-**	**-**	**-**	**21**	**49**	**70**	**6**	**36**	**42**
මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය	293	7	300	101	-	101	293	7	300	12	-	12
මුළු එකතුව	**311**	**82**	**393**	**101**	**-**	**101**	**314**	**56**	**370**	**18**	**36**	**54**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

අර්ධකාලීන ආධුනිකත්ව පුහුණුවෙහි පුහුණු කිරීම් කාර්යයන්හි සාරාංශය මෙමඟින් නිරූපණය වේ. තෝරාගත් පාඨමාලා කිහිපයක් අර්ධකාලීන පාඨමාලා ලෙස දිස්ත්‍රික්ක කිහිපයක හා ප්‍රධාන ලෙස ජාතික ආයතන දෙකක ක්‍රියාත්මක වේ. එහිදී සමාලෝචිත වසර තුළදී 393ක් වූ ආධුනිකයින් බඳවා ගෙන ඇති අතර ආධුනිකයින් 54ක් තවදුරටත් පුහුණුවේ රැඳී සිටියි.

වගුව 09 - ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක

වෘත්තීන්	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ගොඩනැගිලි හා ව්‍යුහ	බඳවා ගැනීමේ විභාගය පැවැත්වූ නමුත් කොරෝනා තත්ත්වය හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වී නොමැත			62		62	81	23	104	149	44	193
ජල හා පාරිසරික				-	-	-	12	20	32	49	36	85
අධිවේගී මාර්ගය සහ දුම්රිය				7	0	7	25	6	31	44	34	78
විදුලි බලය				2	1	3	46	16	62	39	53	92
විදුලි සංදේශ				-	-	-	-	-	-	-	-	-
ඉලෙක්ට්‍රොනික්				1	2	3	42	13	55	158	14	172
ස්වයංචලන				-	-	-	14	-	14	50	1	51
යාන්ත්‍රික				1	-	1	45	3	48	130	45	175
නාවුක				-	-	0	16	-	16	42	-	42
එකතුව				**73**	**3**	**76**	**281**	**81**	**362**	**661**	**227**	**888**

***පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂ වල බඳවාගත් ආධුනිකයන් ද ඇත.

ඉංජිනේරු ඩිප්ලෝමාවන් පිරිනමන ආයතනයන් අතර ප්‍රමුඛ ස්ථානයක් ගන්නා කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය ප්‍රධාන පාඨමාලා 09ක් යටතේ ආධුනිකයන් පුහුණු කරනු ලබන අතර 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය හමුවේ එම පාඨමාලා වලට ආධුනිකයන් බඳවාගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීම සිදු කළත් බඳවා ගැනීම් කිසිවක් සිදු කිරීමට නොහැකි විය. 2021 වසර වන විට 362 ක් වූ ආධුනිකයින් පාඨමාලාව සාර්ථකව අවසන් කර ඇති අතර ආධුනිකයින් 888ක සංඛ්‍යාවක් තවදුරටත් පුහුණුවේ යෙදී සිටී.

වගුව 10 - කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද

වෘත්තීන්	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ශීතකරණ හා යාන්ත්‍රික ශිල්පී	16	0	16	13	-	13	16	-	16	33	-	33
විදුලි ශිල්පී (විශේෂ)	36	0	36	28	-	28	50	-	50	127	-	127
විදුලි ශිල්පී (Enterprise Based Vocational Education Center - Holcim)	14	1	15	2	1	3	-	-	-	12	-	12
ඉලෙක්ට්‍රොනික් ශිල්පී (විශේෂ)	28	0	28	23	0	23	33	1	34	68	3	71
වෑද්දුම්කරු (සාමාන්‍ය)	15	-	15	5	-	5	-	-	-	10	-	10
යන්ත්‍රකරු (විශේෂ)	23	-	23	-	-	-	21	-	21	97	-	97
වඩු කාර්මික	6	0	6	8	-	8	10	-	10	14	-	14
ඉදිකිරීම් සුපරීක්ෂක	13	7	20	11	7	18	50	9	59	26	8	34
ප්‍රමාණ සමීක්ෂණ සහකාර	12	8	20	-	5	5	-	-	0	12	3	15
ජල නල කාර්මික	12	0	12	3	-	3	19	1	20	25	-	25
පොත් බඳින්නා	4	4	8	1	8	9	2	15	17	7	3	10
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ	20	17	37	12	6	18	22	26	48	20	31	51
පරිගණක චිත්‍ර ශිල්පී	16	5	21	6	1	7	6	6	12	26	10	36
පෑස්සුම්කරු (විශේෂ)	18	0	18	23	-	23	26		26	59	-	59
එකතුව	**233**	**42**	**275**	**135**	**28**	**163**	**255**	**58**	**313**	**536**	**58**	**594**

***පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුව හැර යාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින් ද ඇත.

කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සමාලෝචිත වර්ෂය තුළ ප්‍රගතිය ඉහත වගුව මඟින් නිරූපණය කෙරේ. ඒ අනුව ආධුනිකයින් 275ක සංඛ්‍යාවක්, පාඨමාලා 15ක් යටතේ පුහුණුව සඳහා අනුයුක්ත වී ඇත. එහිදී තොරතුරු තාක්ෂණ පාඨමාලාව සහ විදුලි කාර්මික පාඨමාලාව සඳහා වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් අනුයුක්ත වී ඇති අතර, ආධුනිකයන් 313 දෙනෙකු පුහුණුව සාර්ථකව නිමකර ඇත. එමෙන්ම ආධුනිකයින් 594 දෙනෙකු තවදුරටත් පුහුණුව තුළ රැඳී සිටිති.

වගුව 11 - මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත

වෘත්තීන්	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ
වාහන යාන්ත්‍රික ශිල්පී	-	-	-	39	-	39	120	-	120	281	1	282
වාහන විදුලි ශිල්පී	-	-	-	35	-	35	56	-	56	124	0	124
යන්ත්‍රකරු	-	-	-	9	-	9	20	-	20	55	0	55
වාහන ටින්කර්	-	-	-	10	-	10	-	-	0	42	0	42
වාහන පින්තාරුකරු	12	-	12	10	-	10	-	-	0	59	0	59
වාහන වායුසමීකරණ තාක්ෂණික ශිල්පී	-	-	0	8	-	8	21	-	21	24	0	24
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ	12	13	25	0	-	0	-	-	0	23	35	58
එකතුව	**24**	**13**	**37**	**111**	-	**111**	**217**	-	**217**	**608**	**36**	**644**

***පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුව හැර යාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින් ද ඇත.

සමාලෝචිත වර්ෂය තුළ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි ප්‍රගතිය නිරූපණය වේ. 2021 වසර තුළදී ආධුනිකයින් පාඨමාලාවන් දෙකක් සඳහා ප්‍රධාන වශයෙන් අනුයුක්ත වී ඇති අතර එය සංඛ්‍යාත්මකව 37කි. මේ වන විට ආධුනිකයින් 644ක් පුහුණුව තුළ රැඳී සිටින අතර සමස්ත පාඨමාලාව අවසන් කළ සිසුන් ගණන 217කි.

ප්‍රස්ථාරය -04 පැරටෝ විශ්ලේෂණය (මධ්‍යස්ථාන පාදක පුහුණු කිරීම)



කර්මාන්ත පාදක පුහුණුව තුළින් දිස්ත්‍රික්කයන් තුළ ආධුනිකයින්ගේ පාඨමාලා සඳහා ඇති ඉල්ලුම මෙම පැරටෝ විශ්ලේෂණ ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ. එහිදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර ප්‍රධාන වශයෙන් පාඨමාලා 05ක් සඳහා ඉහළ ආධුනිකයින් සංඛ්‍යාවක් යොමු වී ඇත. ඒ අතර පරිගණක චිත්‍ර ශිල්පී, හෙද සහායක, පුද්ගලික ලේකම් (ඉංග්‍රීසි) හා රූපලාවණ්‍ය ශිල්පී පාඨමාලා වේ.

ප්‍රසථාරය 05 - පැරටෝ විශ්ලේෂණය (කර්මාන්ත පාදක පුහුණු කිරීම)



පැරටෝ විශ්ලේෂණය මඟින් නිරූපණය කරන්නේ දිස්ත්‍රික් මට්ටමින් පවතින මධ්‍යස්ථාන පාදක පුහුණු කිරීම්හි පාඨමාලා ඉල්ලුමෙහි විචලනයයි. එහිදී ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) පාඨමාලාව සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බව මෙමඟින් නිරූපණය වේ.

ප්‍රස්ථාරය 06 - පැරටෝ විශ්ලේෂණය (ජාතික ආයතන)



ජාතික ආයතන සඳහා බඳවා ගැනීම් තුළ වැඩිම ඉල්ලුමක් සහිත පාඨමාලා විචලනය වූ අයුරු මෙම පැරටෝ විශ්ලේෂණ ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ. එහිදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව සඳහා වැඩිම ඉල්ලුමක් පවතින අතර පාඨමාලා 09ක් සඳහා ද ආධුනිකයින් වැඩි නැඹුරුතාවක් දක්වා ඇති බව නිරූපණය වේ.

වගුව 12 : රැකියා ලක්ෂය වැඩසටහන් ප්‍රගතිය

දිස්ත්‍රික්කය	මූලික පුහුණුව			රැකියාස්ථ පුහුණුව			අවසන් පරීක්ෂණය	
	බඳවා ගැනීම්	පුහුණුව හැරයාම	අවසන් කළ සංඛ්‍යාව	සම්පූර්ණ කිරීම	පුහුණුව හැරයාම	පුහුණුවේ රැඳී සිටීම 2021.12.31	පැවැත් වූ සංඛ්‍යාව	පැවැත්වීමට නියමිත සංඛ්‍යාව 2021.12.31
කොළඹ	2,151	141	2,010	240	276	1,494	240	1,300
ගම්පහ	2,815	144	2,671	33	234	2,404	33	1,715
කළුතර	2,069	76	1,993	170	-	1,823	170	1,622
මහනුවර	2,171	83	2,088	261	32	1,795	261	3
මාතලේ	1,453	30	1,423	195	38	1,190	195	1,494
නුවරඑළිය	914	36	878	265	3	610	265	859
ගාල්ල	1,785	75	1,710	836	15	859	836	2,404
මාතර	2,453	67	2,386	587	18	1,781	587	1,187
හම්බන්තොට	1,419	59	1,360	143	30	1,187	143	1
යාපනය	95	3	92	91	-	1	91	1,823
මන්නාරම	43	1	42	36	-	6	36	1,795
වවුනියා	110	2	108	104	-	4	104	1,176
මුලතිව්	54	-	54	52	-	2	52	1
කිළිනොච්චි	12	1	11	10	-	1	10	3,100
මඩකළපුව	250	2	248	243	2	3	243	6
අම්පාර	1,458	58	1,400	100	-	1,300	100	1,190
ත්‍රිකුණාමලය	340	5	335	319	1	15	319	1,781
කුරුණෑගල	3,278	66	3,212	112	-	3,100	112	598
පුත්තලම	1,060	53	1,007	57	79	871	57	2
අනුරාධපුර	1,939	27	1,912	165	32	1,715	165	610
පොළොන්නරුව	1,172	30	1,142	813	1	328	813	328
බදුල්ල	1,952	71	1,881	251	8	1,622	251	871
මොණරාගල	1,220	22	1,198	585	15	598	585	2,395
රත්නපුර	2,597	107	2,490	95	-	2,395	95	15
කෑගල්ල	1,928	58	1,870	621	73	1,176	621	4
එකතුව	**34,738**	**1,217**	**33,521**	**6,384**	**857**	**26,280**	**6,384**	**26,280**

සමාලෝචිත වර්ෂය තුළ රැකියා ලක්ෂය වැඩසටහනේ ප්‍රගතිය මෙම වගුව මඟින් නිරූපණය කෙරේ. එහිදී බහු කාර්යය සංවර්ධන කාර්ය සාධන බලකාය යටතේ 34,738ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් රැකියා ලක්ෂය වැඩසටහන සඳහා යොමු කර ඇත. එහි දී 33,521 මූලික පුහුණුව සාර්ථකව අවසන් කර ඇති අතර 6,384ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් ඇගයීම් කටයුතු අවසන් කර ඇත.

ප්‍රස්ථාරය 07 - රැකියාස්ථ පුහුණුව පෙර වර්ෂයන් සමඟ සැසඳීම



ඉහත ප්‍රස්ථාරය මඟින්, පෙර වර්ෂයන් තුළ රැකියාස්ථ පුහුණුව සඳහා ආධුනිකයින් බඳවා ගැනීමේ ප්‍රගතිය නිරූපණය කෙරේ. පෙර වසර 10 තුළ දී එහි කිසියම් විචලනයක් පෙන්නුම් කරන අතර 2020 වසරට සාපේක්ෂව රැකියාස්ථ පුහුණුව සඳහා ආධුනිකයින් බඳවා ගැනීමෙහි ප්‍රතිශතය අවම අගයක් ගනී. එය ප්‍රතිශතාත්මකව ගත් කළ 17%ක අවපාතනයක් වේ.

ප්‍රස්ථාරය 08 - විශේෂිත කර්මාන්තගත පුහුණුව පෙර වසර හා සැසඳීම



විශේෂ කර්මාන්තගත පුහුණුව යටතේ වසර 10ක් තුළදී ආධුනික බඳවා ගැනීම් සිදු වූ ආකාරය ඉහත ප්‍රස්ථාරය මඟින් නිරූපණය කෙරේ. එය පෙර වසර වලදී ඉහළ ප්‍රතිශතයක් පෙන්නුම් කළද 2020 - 2021 වසර තුළ දී එහි ප්‍රබල පසුබෑමක් පෙන්නුම් කරයි. කෙසේ වුවද 2020 වසර හා සැසඳීමේ දී 37% කට ආසන්න වූ වර්ධනයක් ආධුනික බඳවා ගැනීමේ ප්‍රතිශතයෙහි දක්නට ලැබේ.

වගුව 13 - සහතිකපත් නිකුත් කිරීම

වර්ගය		පරීක්ෂණ පැවැත්වූ සංඛ්‍යාව		අවසන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වූ සංඛ්‍යාව		සහතිකපත් ලබාදුන් සංඛ්‍යාව	
		2020	2021	2020	2021	2020	2021
කර්මාන්ත ශිල්පී	මධ්‍යස්ථාන පාදක	73	24	35	14	1,408	1,185
	කර්මාන්ත පාදක	1,726	1,208	1,563	1,093		
ස්ථානානුරූපී		476	270	457	261	676	233
ග්‍රාමීය මට්ටම		157	45	156	36	217	89
ඉංජිනේරු තාක්ෂණ ආයතනය		-	341	-	341	-	392
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය		219	76	-	76	-	81
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය		110	68	93	-	-	-
ජාතික වෘත්තීය සුදුසුකම	මධ්‍යස්ථාන පාදක	901	695	857	653	1,181	1,189
	කර්මාන්ත පාදක	2,781	3,007	2,781	724	1,462	1,136
	පෙර දැනුම පසු ඇගයීම	1,272	2,571	1,249	2,448	5,559	3,147
විශේෂ කර්මාන්ත පුහුණුව		3,601	5,213	3,601	5,213	1,991	2,473
රැකියාස්ථ පුහුණුව		-	-	-	-	3	2
වෙනත්		3,509	247	3,509	197	3,509	287
එකතුව		**14,825**	**13,765**	**14,301**	**11,056**	**16,006**	**10,214**

මෙමඟින් පරීක්ෂණ කටයුතු සිදු කිරීම, සමත් සිසුන් සංඛ්‍යාව හා සහතිකපත් නිකුත් කිරීම කෙසේ විචලනය වූවාද යන්න නිරූපණය කෙරේ. එහිදී 13,765ක ආධුනිකයින් ප්‍රමාණයක් පරීක්ෂණය සඳහා මුහුණ දුන් අතර 11,056ක් අවසන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය. තවද 10,214ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් සඳහා සහතික පත්‍ර ලබා දී ඇත.

වගුව 14 - ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සංවර්ධන ප්‍රගතිය

ක්‍රියාකාරකම	සංවර්ධිත සංඛ්‍යාව	වලංගු ගත කිරීම් සංඛ්‍යාව	පුනරීක්ෂණ සංඛ්‍යාව
ජාතික නිපුණතා සම්මතයන් සහ විෂයමාලා	13	32	13
ඇගයීම් සම්පත්	11	-	-
පරීක්ෂණ පත්‍ර	2	-	-
ඉගෙනීමේ මාර්ගෝපදේශන පෙළ පොත්	3	-	-
එකතුව	**29**	**32**	**13**

සමාලෝචිත වසරේ වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ ජාතික නිපුණතා සම්මත 29ක් සංවර්ධනය කර ඇති අතර පාඨමාලා ජාතික නිපුණතා ප්‍රමිතීන් සහ විෂයමාලා වලංගුගත කිරීම් 32ක් හා සංශෝධන 13ක් මෙම වසර තුළදී සිදු කර ඇත.

වගුව 15 - කාර්ය මණ්ඩල තොරතුරු

වැටුප් තලය	සේවා කාණ්ඩය	අනුමත සංඛ්‍යාව	2021/12/31 විට සේවක සංඛ්‍යාව
HM	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	6	3
MM	මධ්‍යම මට්ටමේ කළමනාකරු	21	17
AR	අධ්‍යයන හා පර්යේෂණ	94	43
JM	කනිෂ්ඨ කළමනාකරු	113	79
MA 4	ක්‍රියාත්මක කිරීමේ සහ උපදේශන සේවා	655	448
MA 3	ආශ්‍රිත නිලධාරීන්	2	-
MA	කළමනාකරණ සහකාර	315	261
PL	ප්‍රාථමික මට්ටමේ සේවා	152	134
එකතුව		**1,358**	**985**

2021 වසර වන විට අප ආයතනය තුළ 985ක් වූ සේවක මණ්ඩලයක් සේවයෙහි නිරත වේ.

2022 වර්ෂයේ ඉලක්ක

- 2022 වසර සඳහා ආධුනිකයින් 65000ක් බඳවාගැනීම සහ පුහුණු කිරීම.

  ඒ යටතේ,

  - පුහුණුවන්නන් 15000ක් සඳහා කාර්‍යස්ථ පුහුණුව ලබා දීම.
  - විශේෂ කර්මාන්ත පුහුණුව යටතේ ආධුනිකයින් 20000ක් බඳවා ගැනීම හා පුහුණු කිරීම.
  - 13න් වසරක අධ්‍යාපන වැඩසටහන යටතේ ආධුනිකයින් 800ක් බඳවාගැනීම

- රැකියා ලක්ෂය වැඩසටහන යටතේ ආධුනිකයින් 65,200ක් සඳහා පුහුණුව ලබාදීම
- මාළඹේ පරිපූරක වෛද්‍ය කාර්මික පුහුණු ආයතනය හා හම්බන්තොට ජාතික කාර්මික පුහුණු ආයතනය ඉදිකිරීමට සැළසුම් කිරීම
- මන්නාරම, හම්බන්තොට පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම
- නව පුහුණු සම්මත හා පුහුණු මාර්ගෝපදේශ සකස් කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම 1 හා 2 සඳහා ජාතික නිපුණතා සම්මත, විෂයමාලා හා තක්සේරු සම්පත් හඳුන්වාදීම
- විදේශ ශ්‍රමිකයින් සඳහා විදේශ භාෂා පාඨමාලා හඳුන්වාදීම
- කර්මාන්ත ශිල්පී පාඨමාලා ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම දක්වා පරිවර්තනය කිරීම.
- නව පාඨමාලා හා මොඩියුල හඳුන්වාදීම
- සංක්‍රමණික ශ්‍රමිකයින් සහ කොවිඩ් 19 බලපාන ලද ශ්‍රමිකයින් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම හඳුන්වාදීම
- කාර්යස්ථ පුහුණු හා යන්ත්‍රාගාර පුහුණු සේවා සියලුම විභව පාර්ශවකරුවන් වෙත ව්‍යාප්ත කිරීම
- දිවයින පුරා සමත් වූ අභ්‍යාසලාභීන් සඳහා නැවත පුහුණුව හා වැඩිදුර පුහුණුව හඳුන්වාදීම
- දිස්ත්‍රික් කාර්යාල හා දිස්ත්‍රික් පුහුණු කිරීම් මධ්‍යස්ථාන 18ක් නවීකරණ කටයුතු කිරීම හා නව පුහුණු උපකරණ මිලදී ගැනීම
- දැනට පවතින දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම හා නව දත්ත පද්ධතියක් ප්‍රතිෂ්ඨාපනය කිරීම

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන්	*2021 (රු.)*		*2020 (රු.)*	
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත හා උපකරණ	2	2,495,481,182.86		2,751,699,145.18	
ප්‍රාග්ධන වැඩ ප්‍රගතිය	3	37,074,048.96	2,532,555,231.82	32,775,840.63	2,784,474,985.81
ජංගම වත්කම්					
තොගය	4	11,629,513.52		14,600,300.45	
ලැබිය යුතු දෑ	5	100,724,146.52		102,009,332.25	
තැන්පතු, පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්	6	53,838,156.05		20,368,461.79	
කෙටිකාලීන ආයෝජන	7	89,126,251.12		78,350,101.37	
මාර්ගස්ථ මුදල්	8	1,798,041.90		762,831.05	
මුදල් හා මුදල් සමානයන්	9	164,899,469.26	422,015,578.37	177,604,288.31	393,695,315.22
මුළු වත්කම්			**2,954,570,810.19**		**3,178,170,301.03**
කොටස් සහ වගකීම්					
සමුච්චිත අතිරික්තය/(හිඟය)	11	855,550,267.17		936,910,721.41	
සමුච්චිත අතිරික්තය අර්ධ කාලීන	11a	42,671,516.72		42,671,516.72	
සංචිත	11b	638,668,797.82		522,598,339.35	
රජයේ ප්‍රදාන-ප්‍රාග්ධන	11c	7,231,251.52		12,499,162.90	
රජයේ ප්‍රදාන -SSDP	11d	62,789,506.99		62,789,506.99	
විලම්බිත ආදායම	13	897,154,441.03	2,504,065,781.25	1,113,606,890.65	2,691,076,138.02
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික ප්‍රතිපාදන	12	252,257,655.00	252,257,655.00	260,766,245.50	260,766,245.50
ජංගම වගකීම්					
ගෙවිය යුතු	10	198,247,373.94	198,247,373.94	226,327,917.51	226,327,917.51
මුළු කොටස් සහ වගකීම්			**2,954,570,810.19**		**3,178,170,301.03**

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 8 සිට 19 දක්වා සටහන් ආකෘති පත්‍ර මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසකි.

සහතික කිරීම

ඉහත මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දිනට සිදු කළ කටයුතු සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි අතිරික්තය/(හිඟය) පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව අපි සහතික කරමු.

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය හා බැඳේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත් අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඩබ්. එම්. ඒ. කේ වීරසේකර
අධ්‍යක්ෂ (මුදල්)

ආචාර්ය කාංචන සිල්වා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩබ්ලිව්. රුචික අමරසේකර
සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැකිකඩ, රාජගිරිය

ඩබ්. රුචික අමරසේකර
සභාපති /ප්‍රධාන විධායක නිලධාරී

ඩී. ආර්. සෝමවර්ධන මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික ආධුනිකත්ව සහ පුහුණු කිරීම් අධිකාරිය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

විස්තරය	*සටහන්*	*2021 (රු.)*	*2020 (රු.)*
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		1,093,500,000.00	1,083,500,000.00
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන පුනරුත්තාපනය		8,990,978.79	4,131,349.37
ස්වයං උත්පාදක ආදායම්	11a		-
මාරුකල විලම්බිත ආදායම්	13	84,680,849.37	120,666,730.84
වෙනත් ආදායම්			
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන		28,829,335.01	16,592,926.99
අනෙකුත් ආධාර	14	137,075.00	8,961,505.52
MPDTF (රැකියා ලක්ෂය) ප්‍රදාන - බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය		88,823,618.04	
අමාත්‍යාංශයේ ප්‍රදාන - නිපුණතා සිසු සවිය වැඩසටහන		15,819,000.00	
වෙනත් ආදායම්	15	78,309,067.10	55,559,579.48
මුළු ආදායම		**1,399,089,923.31**	**1,289,412,092.20**
මෙහෙයුම් වියදම්			
පුහුණු ද්‍රව්‍ය	16	14,367,681.27	11,966,251.50
වෙනත් පුහුණු වියදම්	17	184,330,473.80	94,988,254.78
කාර්ය මණ්ඩල වියදම්- පෞද්ගලික වේතන	18	739,442,023.76	719,683,691.90
කාර්ය මණ්ඩල වියදම්-වෙනත්	19	25,227,389.43	61,227,575.74
ප්‍රවාහන හා සන්නිවේදන	20	70,611,989.38	57,036,260.64
සැපයුම් සහ කාර්යාල අවශ්‍යතා	21	17,709,596.44	20,527,602.70
උපකරණ නඩත්තුව	22	7,764,529.91	6,432,302.79
පරිශ්‍ර නඩත්තුව	23	157,983,472.86	128,792,638.48
මූල්‍ය හා වෙනත් වියදම්	24	6,312,258.21	7,870,914.28
ක්ෂයවීම්	25	231,946,085.35	223,859,441.94
විගණන ගාස්තු		1,171,500.00	735,617.32
සම්පූර්ණ මෙහෙයුම් වියදම්		**1,456,867,000.41**	**1,333,120,552.07**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය (හිඟය)		**(57,777,077.10)**	**(43,708,459.87)**
අතිරික්ත/හිඟ පිළිබඳ සමුච්චිත ප්‍රකාශය			
නයිටා අරමුදල			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දිනට		1,151,839,418.43	1,163,368,948.25
පෙර වර්ෂයේ ගැළපීම්		(23,583,377.14)	(11,529,529.82)
වසර අවසාන ශේෂය		1,128,256,041.29	1,151,839,418.43
පසුගිය වසරවල රඳවා ගත් ඉපැයීම්		(214,928,697.02)	(171,220,237.15)
අර්ධකාලීන			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දිනට අර්ධ කාලීන		42,671,516.72	36,228,874.49
පෙර වර්ෂයේ ගැළපීම්		-	6,442,642.23
වර්ෂයේ ගැළපීම්		-	-
නැවත සඳහන් කර ඇති පරිදි ජනවාරි 1 වන දිනට		955,998,860.99	1,023,290,698.00
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		(57,777,077.10)	(43,708,459.87)
දෙසැම්බර් 31 වැනි දිනට ශුද්ධ අතිරික්තය/(හිඟය)		**898,221,783.89**	**979,582,238.13**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	*සටහන්*	*2021 (රු.)*		*2020 (රු.)*
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය (හිඟය)		(57,777,077.10)		(43,708,459.87)
ගැලපීම්:				
ක්ෂයවීම		231,946,085.35	223,859,441.94	
විලම්බිත ආදායම්		(84,680,849.37)	(120,666,730.84)	
වත්කම් බැහැර කිරීමේ පාඩුව		2,125.06	3,198.67	
වත්කම් බැහැර කිරීමේ ලාභය		(3,148.79)	(4,067.25)	
බොල් ණය කාර්ය මණ්ඩල ණය		(68,671.00)	219,550.00	
විවිධ ණයකරුවන් සඳහා බොල් ණය		(20,785.09)	(112,549.51)	
පෙර වෂී ගැලපුම නයිටා ගිණුමේ ලාභය.		-	(15,935,510.46)	
ස්ථීර තැන්පතුවෙන් ලද පොළිය		(8,990,978.79)	(8,428,889.63)	
උපචිත සඳහා නොඉක්මවූ ප්‍රතිපාදන		1,957,838.47	(4,047,562.97)	
උපචිත සඳහා ඉක්මවූ ප්‍රතිපාදන		(9,332,580.14)	-	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		13,133,719.50	49,348,349.50	
පාරිතෝෂික ගෙවීම්		(21,642,310.00)	(25,271,255.00)	
SLGTI වත්කම් භූවමාරු ලාභය		(16,297,465.69)		
භාණ්ඩ අලාභය		30,426.39		
තොග වැඩිවීම/අඩු වීම		2,970,786.93	490,636.33	
අය විය යුතු දේ අඩු/වැඩි වීම්		1,285,185.73	5,891,290.15	
තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම්වල අඩු/වැඩි වීම්		(33,469,694.26)	8,334,437.72	
කෙටිකාලීන ආයෝජන අඩු /වැඩි වීම්		(8,243,558.95)	(3,261,671.93)	
ගෙවිය යුතු දේ අඩු/වැඩි වීම්		(28,080,543.57)	(38,795,616.08)	
		40,495,581.78		71,623,050.64
මෙහෙයුම් ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		(17,281,495.32)		27,914,590.77
ආයෝජන ක්‍රියාකාරකම්				
පිරියත හා උපකරණ මිලදී ගැනීම		(47,734,963.35)	(22,058,145.52)	
වැඩ කෙරෙමින් පවතින ප්‍රාග්ධනයන්		(4,298,208.33)	15,999,166.34	
ස්ථාවර වත්කම් විකිණීම්වලින් ඉදිරියට		-	-	
විලම්බිත ආදායම් අතිරේකයන් ගැළපීම්		(52,033,171.68)	-	
ආයෝජන ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		(52,033,171.68)		(6,058,979.18)
මූල්‍ය ක්‍රියාකාරකම්				
රජයේ ප්‍රදාන ප්‍රාග්ධන		40,096,000.00	37,281,750.33	
SSDP ප්‍රාග්ධන		-	2,426,027.46	
ලද ආධාර		17,799,956.50	759,900.00	
ලද ස්ථාවර තැන්පතු පොලී		2,281,693.10	-	
		60,177,649.60	-	
ආයෝජන කටයුතු නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		60,177,649.60		40,467,677.79
මුදල් හා මුදල් වලට සමාන ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		(9,137,017.40)		62,323,289.38
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		193,544,607.89		131,221,318.51
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		**184,407,590.49**		**193,544,607.89**

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	SSDP ප්‍රාග්ධන	විලම්බිත ආදායම් ප්‍රදාන (වගකීම්)	ආධාර ලැබීම්	අර්ධ කාලීන ගිණුම් මත ලාභය	යතුරුපැදි ආදායම් සංචිත	අර්ධ කාලීන ප්‍රාග්ධන සංචිත	අර්ධ කාලීන අනිවාර්යය සංචිත	AETI ඉඩම් හුවමාරු කිරීමේ ලාභය	නැවත තක්සේරු කිරීමේ සංචිතය	එකතුව
2021 ජනවාරි මස 01 දිනට ශේෂය	**1,151,839,418.43**	**12,499,162.91**	**62,789,506.99**	**1,113,606,890.82**	**114,363,459.55**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**92,907,959.29**	**2,906,004,835.05**
එකතුකිරීම්: ආධාර ලැබීම් 2021					62,716,199.91							**62,716,199.91**
එකතුකිරීම්: ගැලපීම්				1,237,755,701.22	1,223,271,018.41							**2,461,026,719.63**
ඉපැයීම් රඳවා ගැනීම	(214,928,697.02)											**(214,928,697.02)**
නැවත සඳහන් කර ඇති ආරම්භක ශේෂය	**936,910,721.41**	**12,499,162.91**	**62,789,506.99**	**2,351,362,592.04**	**1,400,350,677.87**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**92,907,959.29**	**5,214,819,057.57**
GOSL වසර සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන		40,096,000.00										**40,096,000.00**
ප්‍රාග්ධන අඑත්වැඩියා		(8,990,978.79)										**(8,990,978.79)**
වසරේ ලාභය	(57,777,077.10)											**(57,777,077.10)**
වෂ්ය සඳහා ගැලපීම්	(23,583,377.14)			-1,437,232,343.06	(1,215,131,618.41)							**(2,675,947,338.61)**
නැවත තක්සේරු කිරීමේ ලාභය											76,546,967.56	**76,546,967.56**
විලම්බිත වගකීමට මාරු කිරීම්		(36,372,932.59)		67,705,041.59	-31,332,109.00							-
විලම්බිත ආදායමට මාරු කිරීම්				-84,680,849.37								**(84,680,849.37)**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**855,550,267.17**	**7,231,251.53**	**62,789,506.99**	**897,154,441.20**	**153,886,950.46**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**169,454,926.85**	**2,504,065,781.26**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කිරීමේ ආයතනය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත කොට ඇති ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (මින් ඉදිරියට ආයතනය ලෙස සඳහන් කෙරේ) අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කර ඇත.

මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත සකස් කෙරේ. මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් සටහන් කොට ඇත.

2.1 මූල්‍ය වර්ෂ 2021 තුළදී, ටැලි පද්ධති ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන ශේෂයන් සැසඳුම සඳහා ජාතික මධ්‍යස්ථානවල අර්ධකාලීන පාඨමාලා සම්බන්ධ ගනුදෙනු ටැලි පද්ධතියට ගෙන ඇත.

3. සංසන්දනාත්මක තොරතුරු

පසුගිය වර්ෂයට අදාළ අගයන් අදාළ වසරේ ඉදිරිපත් කිරීම් සමඟ අදාළ වන පරිදි ගලපා ඇත.

4. රජයේ ප්‍රදාන සහ ආධාර

4.1 සංවිධානයේ වියදම් රජයේ ප්‍රදාන මත රඳා පවතින එම ප්‍රදාන ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇත. පුනරාවර්ථන වියදම් සඳහා අදාළ රජයේ ප්‍රධාන විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට බැර කර ඇති අතර ප්‍රාග්ධන වියදම් සඳහා ලැබීම් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අරමුදලට බැර කර ඇත.

4.2 වත්කම් මාරු කිරීම් ලෙස ලැබෙන රජයේ ප්‍රදානයන් විලම්භිත ආදායම් ලෙස සලකා ඒවායේ ආයුකාලය අනුව ගිණුම් ගත කර ඇත.

5. වත්කම් සහ තක්සේරු කිරීම් පදනම

5.1 තොග

තොග සාමාන්‍යයෙන් පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. යල් පැන ගිය මුද්‍රිත ද්‍රව්‍ය තොග සඳහා 5%ක වෙන් කිරීමක් කර ඇත.

5.2 ලැබිය යුතු

අයවිය යුතු ප්‍රමාණයන් එපරිද්දෙන් දක්වා ඇති අතර 2021.12.31 දින වන විට අධිකාරියේ සේවය නොකරන සේවකයින්ගේ අඩමාන සහ බොල් ණය සඳහා 100% ප්‍රතිපාදන ලබා දී ඇත. අභ්‍යන්තර ගනුදෙනු වලින් අයවිය යුතු ණය හැර අනෙකුත් සියලුම ණයකරුවන් සඳහා 5% ප්‍රතිපාදන බොල් සහ අඩමාන ණය ලෙස ලබා දී ඇත.

5.3 දේපල, යන්ත්‍ර සහ උපකරණ

(I) දේපල, යන්ත්‍ර සහ උපකරණ සහ ආයෝජන දේපල පිළිගැනීම සහ මිනුම්

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් ඒවා දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය LKAS 16 - දේපල, පිරියත සහ උපකරණ වලට අනුකූලව විශ්වාසදායක ලෙස මැනිය හැක. මුලදී, දේපල, පිරියත සහ උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙනි.

(II) පිරිවැය ආකෘතිය

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය එහි මිලදී ගැනීමේ මිල සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැයකින් සමන්විත වේ. අධිකාරියේ කාර්ය සාධනය ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර වත්කම් අත්පත් කර ගැනීම, දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

(III) නැවත තක්සේරු කිරීමේ ආකෘතිය:

මූලික හඳුනාගැනීමෙන් පසු මැනීම සඳහා ඉහත සඳහන් කර ඇති හැර අනෙකුත් වත්කම්වල සම්පූර්ණ පන්තිය සඳහා ආයතනය නැවත තක්සේරු කිරීමේ ආකෘතිය යොදයි. ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන තක්සේරු කිරීම් මත පදනම්ව ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන අතර අදාළ ලියකියවිලි නොමැතිකම සහ කාල සීමාවන් හේතුවෙන් සම්පූර්ණ වත්කම් පන්තිය සම්පූර්ණ කිරීමට නොහැකි විය.

ස්වාධීන තක්සේරුකරුවන් සහ NAITA හි වත්කම් නැවත තක්සේරු කිරීම සඳහා පත් කරන ලද කමිටුව, සමාන වත්කම්වල වර්තමාන වෙළඳපල මිල පවතින විට, එවැනි වත්කම්වල සාධාරණ වටිනාකම් තීරණය කිරීමේදී එවැනි සාක්ෂි සැලකිල්ලට ගනී. එවැනි දේපල නැවත තක්සේරු කරන ලද ප්‍රමාණයන්ගෙන් ගෙන යනු ලැබේ, පසුකාලීනව සමුච්චිත ක්ෂයවීම් සහ නැවත ඇගයීමේ දිනට පසුව අය කරන ලද සමුච්චිත අලාභ හානිවලට වඩා අඩුය. වත්කමක් නැවත තක්සේරු කරන විට, රැගෙන යන අගයේ යම් වැඩි වීමක් වෙනත් විස්තීරණ ආදායමකින් හඳුනාගෙන ප්‍රති ඇගයීම් සංචිතය යටතේ කොටස්වල එකතු වේ, එය ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රති තක්සේරු කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර, කලින් වියදම් කළ අඩුවීමේ ප්‍රමාණයට වැඩි වීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ප්‍රති තක්සේරුවේදී පැන නගින රැගෙන යන අගයේ අඩුවීමක් ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර, එම වත්කමේ පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායමකින් හඳුනාගනු ලබන්නේ ඒ සම්බන්ධයෙන් ප්‍රති තක්සේරු කිරීමේ අතිරික්තයේ ඇති ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයකටය. වත්කම් ඕනෑම අතිරික්තයක් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පිළිගැනේ.

වත්කමක් සම්බන්ධයෙන් නැවත තක්සේරු කිරීමේ සංචිතයේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක්, විශ්‍රාම යාමේදී හෝ වත්කම් බැහැර කිරීමේදී රඳවාගත් ඉපැයීම් වෙත සෘජුවම මාරු කරනු ලැබේ. ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා හෝ ආයතනයේ ඉපැයීමේ ධාරිතාව, කාර්යක්ෂමතාව හෝ ක්‍රියාකාරීත්වයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. වත්කම් රැගෙන යන ප්‍රමාණයෙන් හඳුනාගෙන ඇත.

(IV) හඳුනා නොගැනීම

දේපල, කම්හල් සහ උපකරණ බැහැර කිරීමේදී හෝ මාරු කිරීමේදී හෝ ඒවා භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැරකිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යන ප්‍රමාණය අතර වෙනස ලෙස ගණනය කෙරේ) වත්කම් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ 'අනෙකුත් මෙහෙයුම් ආදායම්' තුළ හඳුනා නොගෙන ඇත.

(V) අස්පෘශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග හඳුනාගැනීමේ පදනම

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

සමාගම විසින් දරනු ලබන, භාවිත කිරීමට බලපත්‍ර ලබා දී ඇති, ඒ ආශ්‍රිත දෘඩාංගවලට අත්‍යවශ්‍ය නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, සමාගම විසින් දරනු ලබන, භාවිත කිරීමට බලපත්‍ර ලබා දී ඇති, ඒ ආශ්‍රිත දෘඩාංගවලට අත්‍යවශ්‍ය නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසදායක ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභවලට තුඩු දෙනු ඇතැයි සිතිය හැකි සියලුම පරිගණක මෘදුකාංග පිරිවැය අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්ත්වය සහ අඩුවෙන් සමුච්චිත ක්‍රමක්ෂකරණය සහ සමුච්චිත හානි පාඩු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් වේ.

(VI) කෙටි ආයු කාලයක් ඇති ඉන්වෙන්ට්‍රි

ප්‍රාග්ධනීකරණයට ද්‍රව්‍ය නොවන කෙටි ආයු ස්වභාවයක් ඇති ඉන්වෙන්ටරි අයිතම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හරිනු ලැබේ. කෙසේ වෙතත්, පාලනය කිරීමේ අරමුණ සඳහා මෙම අයිතම ඉන්වෙන්ටරි කර ඇති අතර භෞතික පාලනය ක්‍රියාත්මක වේ.

(VII) ක්ෂය වීම්

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකිනි.

වත්කම් කාණ්ඩය	**ක්ෂය වීම් අනුපාතය**
බදු සමඟ පවතින ඉඩම්	කල් බදු කාලය තුළ
ගොඩනැගිලි	5%
පිරියත හා උපකරණ	10%
ගෘහ භාණ්ඩ , සවිකුරු හා කාර්යාල උපකරණ	10%
පරිගණක උපාංග	25%
මෝටර් රථ	25%
පුස්තකාල පොත්	10%
පුහුණු උපකරණ	10%
අස්පෘශ්‍ය වත්කම්	10%

6. මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් හා මුදල් සමාන ලෙස අර්ථ දැක්විය හැක.

අතැති මුදල් සහ බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මාර්ගස්ථ මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන ලෙස සැලකේ.

7. වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ දිනට ඇති සියලුම වගකීම් මුදල් ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර දැනටමත් පවතිනවා යැයි සැලකෙන වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ නොහැක. ඉල්ලුම මත සිදුකළ යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත සිදු කළ යුතු ගෙවීම්, මූල්‍ය ප්‍රකාශයේ වර්තමාන වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍රයේ දින සිට වසරකට පසුව සිදුකළ යුතු ගෙවීම් වත්මන්-නොවන වගකීම් ලෙස මුදල් ප්‍රකාශයේ සැලකේ.

8. පාරිතෝෂික ප්‍රතිපාදන

සියලුම සේවකයින්ට ආරම්භක වර්ෂයේ සිට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන ප්‍රතිපාදන පනතට සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 16 වන වගන්තියට අනුව සේවකයෙකු කෙරෙහි මෙම වගකීම බල පැවැත්වෙන්නේ වසර 5ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විටය.

9. නිශ්චිත දායක සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා ගෙවිය යුතු දායක මුදල්, වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේදී සැලකේ.

අධිකාරිය සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 15% සහ 3% ට නොඅඩු මුදලකින් දායක වේ

10. ආදායම

රජයෙන් ලද ආධාර, පුනරාවර්තන වියදම් ලෙස ලද දේශීය හා විදේශීය ආධාර සහ අධිකාරියේ විවිධ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර ඇත. ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ප්‍රධාන අලුත්වැඩියාවන් සහ ප්‍රාග්ධන වත්කම් වැඩිවීම් සඳහා වියදම් කළ මුදල් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ප්‍රාග්ධනිත කර නොමැති අතර සමාන මුදලක් ප්‍රාග්ධන ප්‍රදානවලින් මාරු කර ඇත.

ස්ථාවර වත්කම්වල හඳුනාගත් වගකීම් සහ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසු අතිරික්තය/හිඟය හෝ වියදමට වඩා වැඩි ආදායම ඇති විය.

අධිකාරිය ක්‍රියාත්මක කිරීමේදී සහ එහි ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාමේදී සිදුවන වියදම් අයභාරගත කර ඇත.

11. ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම්

සියලු ද්‍රව්‍යමය ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

12. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත.

13. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විලම්භිත ආදායම් අඩුවීම්/වැඩිවීම් මුදල් නොවන සංචලනයන් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } VOT/D/NAITA/1/2021/30 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 පෙබරවාරි 10 දින

සභාපති

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළඳුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කිලිනොච්චිය ජර්මානු කාර්මික පුහුණු කිරීමේ ආයතනයට අදාලව 2018 වර්ෂයේ සිට පැවති රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන හා විලම්භිත ආදායම් ගිණුම් තැබීමේදී ඇති වී තිබුණු රු. 16,297,465 ක දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව ගැලපුම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් පැවරීමේ ලාභයක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කිරීම නිසා එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ධාරණ අගය රු.110,974,250 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරීම හේතුවෙන් දේපල, පිරියත, උපකරණ වටිනාකම් හා ප්‍රත්‍යාගණන සංචිතය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියට ලැබී තිබුණු රු.67,705,041 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අධිකාරිය යටතේ පවතින කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ඕස්ට්‍රියානු ව්‍යාපෘති අරමුදලින් ඉකුත් වර්ෂයේදී ලබාදී තිබුණු එකතුව රු. 1,584,556,810ක් වූ ගොඩනැගිලි, පුහුණු උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ නවීකරණය හා අධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු කිරීම වෙනුවෙන් වැයකරන ලද රු.168,937,662ක් ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) "Multi purpose Development Task Force Training Programme 100,000" ව්‍යාපෘතිය වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබී තිබුණු රු. 18,770,586 ක් තැන්පත් ගිණුමක රඳවා ගැනීම වෙනුවට වර්ෂයේ ලාභයක් ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) අධිකාරිය වෙත පෞද්ගලික ආයතනයකින් පරිත්‍යාග ලෙස ලැබුණු රු.1,000,000 ක මුදල අධිකාරියේ ආදායම ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සේවක සුභසාධක අරමුදල් ගිණුමකට බැර කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී ආයතන දෙකකින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ටැබ් යන්ත්‍ර 500ක වටිනාකම හා බස්රථයෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් පරිගණක හා මෝටර් රථ වටිනාකම සහ පරිත්‍යාග ගිණුමෙහි ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) අධිකාරියේ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයෙහි 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. 3,351,456 ක වටිනාකමක් සහිත පාඩම්මාලා පොත් 16,235 ක් තොගය යටතේ ගිණුම්ගත කිරීම අත්හැරී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 1,490,345ක් වූ ගෙවිය යුතු පාරිතෝෂික ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනය සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (l) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින්

නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 65 (1)	මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදනය කරන ලද නිශ්චිත කාර්යයන් සහ මුදල් ප්‍රමාණයන් නිසි අධිකාරී බලය නොමැතිව වෙනස් නොකළ යුතු වුවද, ප්‍රාග්ධන වියදම් සඳහා ලබාදී තිබුණු රු. 8,990,978 ක් කිසිදු අනුමැතියකින් තොරව පුනරාවර්තන ස්වභාවයේ වියදම් සඳහා වැයකර තිබුණි
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය	වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව කල යුතු වුවත් ආයතනයේ නිලධාරීන් 09 දෙනෙකුට මාස 08 සිට වසර 03 ක කාල පරාසයත් දක්වා වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණි.
(ඇ)	චක්‍රලේඛ විධිවිධාන	
i.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 6.1 ඡේදය	සෑම නිලධාරී කාණ්ඩයක් සඳහාම අනන්‍ය වූ නිපුණතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සෑම නිලධාරියකුටම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු කාලයක් ආවරණය වන පරිදි මානව සම්පත් සංවර්ධන සැළැස්මක් සකස් කල යුතුය. ඒ අනුව පුහුණු

		ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම වෙනුවට එක් එක් නිලධාරියාට පෞද්ගලික වන සේ අධ්‍යක්ෂ අනුමැතිය මත නිලධාරීන් 10 දෙනකු වෙත 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා පශ්චාත් උපාධි හා වෙනත් පාඨමාලා සඳහා රු. 1,338,537 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. එහෙත් එම පාඨමාලා සම්පූර්ණ කල බවට කිසිදු සාක්ෂික් ලබා ගෙන නොතිබුණි
ii	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/ 2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවූවද, මාස 05 ක ප්‍රමාදයකින් පසුව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 නොවැම්බර් 10 දින ඉදිරිපත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයට හා 5.3.1 (ඇ), 4.1.1 (ඇ) වගන්තිවලට පටහැනිව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණට පරිබාහිරව විනිවිදභාවයකින් තොරව එකම අයිතිකරුවෙකුට අයත් නම් දෙකකින් ව්‍යාපාරික කටයුතු කරන ආයතන දෙකක් තෝරා ගනිමින් 2020 ලෝක තරුණ නිපුණතා දිනය සැමරීමේ ජාතික වැඩසටහන වෙනුවෙන් රු. 1,032,930 ක් වැයකර තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අනුමත කාර්යමණ්ඩලයට අයත් නොවන හා බඳවාගැනීමේ පරිපාටියට පටහැනි ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම යටතේ අධිකාරිය සඳහා අධ්‍යක්ෂ තනතුරකට බඳවාගෙන අධිකාරියේ අරමුණට පරිහානිර කාර්යභාර්යක් ඉටු කරමින් සිටි නිලධාරියකු වෙත 2021 ජූලි සිට 2022 අගෝස්තු දක්වා එකතුව රු. 2,106,740 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) 2018 හා 2021 වර්ෂවල දුරකථන සේවා සමාගමකින් පිළිවෙලින් ටැබ් යන්ත්‍ර 450 හා 500 ක් ලැබී තිබුණු අතර කිසිදු අනුමැතියකින් හා ප්‍රතිපත්තියකින් තොරව අධිකාරියේ විවිධ තනතුරු දරන නිලධාරීන් සඳහා එම ටැබ් යන්ත්‍ර සමග සිම්පත් බෙදාහැර තිබුණි. එමෙන්ම සේවයෙන් ඉවත් වී සිටි නිලධාරීන් 35 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු ටැබ් යන්ත්‍ර ද ආපසු ලබා ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් එකතුව රු. 100,724,147 ක් වූ ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 01 ත් වර්ෂ 16 ත් අතර අයකර නොගත් එකතුව රු.36,312,338 ක් වූ විවිධ ණයගැති ශේෂ සහ එකතුව රු. 1,116,983 ක් වූ සේවක ණයද ඇතුලත් වී තිබූ අතර මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) 2021 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එකතුව රු. 198,247,374 ක් වූ ගෙවිය යුතු ශේෂය තුල වර්ෂ 02 සිට වර්ෂ 14 අතර ගෙවිය යුතු අත්තිකාරම්, තැන්පතු හා විවිධ ණයහිමියන්ගේ එකතුව රු. 83,517,427 ක් වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අධිකාරියේ මූලික පරමාර්ථ ළඟාකර ගැනීම් සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී 2020 හා 2021 වර්ෂවලට අදාලව ආධුනික පුහුණුකිරීම් සම්බන්ධයෙන් ළඟාකර ගැනීමට බලාපොරොත්තු වූ ඉලක්කයෙන් පිළිවෙලින් සියයට 37 හා සියයට 12ක් පමණක් ළඟාකරගෙන තිබීමත්, ආධුනික හැරයාම් පිළිවෙලින් 5119 ක් සහ 2301 ක් වූ අතර වාර්ෂිකව බඳවාගැනීම්වලින් සියයට 42ක ආධුනික සංඛ්‍යාවක් සඳහා පමණක් සහනික පත්‍ර නිකුත් කර තිබීමත් නිරීක්ෂණය විය.

(ඊ) රාජ්‍ය ප්‍රතිපත්තියකට අනුව 2020 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු නිපුණ ශිල්පීන් 100,000 ගෙන් යුත් බහුකාර්යසාධන බලකායක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා ජනාධිපති

කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ 2020 හා 2021 වර්ෂයන්හි පිළිවෙලින් රු.12,470,721 ක් හා රු. 51,944,364ක් වැයකර තිබුණි. ඉන් රු. 4,650,800ක් වැයකර තොරතුරු රැස් කිරීම සඳහා වෙනම පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති අතර මෙම පාඨමාලාව සඳහා පුහුණුව ලැබූ පුහුණු ලාභීන් වෙත සහතිකපත් 32505 ක් නිකුත් කිරීමෙන් තොරව අධිකාරියේ රදවාගෙන තිබුණි.

(උ) නිහ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වලට අදාලව ගෙවන ලද එකතුව රු.82,437,195 ක් වූ අධිභාර හා සේවකයාගෙන් අයවිය යුතු රු.58,908,280 ක් අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් අය කිරීම වෙනුවට ඉකුත් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති